# සිංහල ගද්‍ය රීතිය: ප්‍රාරම්භක සංලක්ෂණ සහ එහි වැඩීම

පිටතලාවේ විමලසාර හිමි

## Abstract

It is the style through which an author conveys his message to the reader, hence style is one of the essential components of a literary work. The quality of a style lies in the literary talent of a writer such as creative power, ingenuity, and the ability to employ the resources of language for the realization of artistic effects. Sinhalese prose writers have created numerous unique prose styles throughout the history of prose literature. This research is aimed to explore the nature, development, and identical features of literary styles at the beginning of Sinhalese prose literature (Anuradhapura era). Eventhough here is evidence to support that the writing took place since the 3rd century B.C, no literary work existed to study its style from the beginning of the literature except the few Hela commentary quotations found in Dampiya Atuva Getapada and 150 small prose passages recently found from Sigiriya. Both Helatuva and Sigiri prose passages are written in contemporary Sinhalese and portray a plain style. Conciseness, practicing short sentences, and usage of derived and local vocabulary are among the major features of this style. The style of the prose passages in Dampiya Atuva Getapathaya is similar to the above style, but shows a great deal of development in terms of vocabulary, phonology, and syntax. The finest form of prose style in Anuradhapura era can be seen in Sikavalanda ha Sikhavalanda Vinisa and Heranasikha ha Heranasiksha vinisa. The prose style of these works is characterized by the predominant use of short sentences, simple and local vocabulary, expressiveness, the employment of rhythemic patterns, skillful use of sounds, concreteness, less use of literary devices. The

influence of Pali also played a vital role in the development of prose styles. Authors, however, have not followed Pali style blindly instead they have developed their own style by showing excellent command of the language and creativity. This study reveals that the style of Sinhalese prose has developed from the early style characterized by simplicity and conciseness to a more perfect form expressive style while maintaining its simplicity alone with the light of Pali style.

**Key-words:** Prose Style, Style, Stylistics, Sinhalese Prose Literature

**ප්‍රමුඛ පදඃ** ගද්‍ය රචනා රීතිය, රචනා රීතිය, රීති විචාරය, සිංහල ගද්‍ය සාහිත්‍යය

**පර්යේෂණ ගැටලුව**

සිංහල ගද්‍ය සාහිත්‍ය රචනා රීතියේ මූලික ස්වරූපය කවරාකාර වූයේ ද, අනුරාධපුර යුගය අවසානය වන විට එහි වැඩීම සිදුව ඇත්තේ කෙසේ ද යන ගැටලු ඔස්සේ මෙම පර්යේෂණය සිදු වේ.

**පර්යේෂණ අරමුණ**

සිංහල ගද්‍ය රීතියේ ප්‍රාරම්භක මග සලකුණු හඳුනා ගනිමින් එහි ස්වභාවය සහ වර්ධනය පිළිබඳ විමර්ශනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ යි.

**පර්යේෂණ සීමා**

ගද්‍ය රචනා රීති වශයෙන් මෙහි දී සැලකෙන්නේ සාහිත්‍ය ලේඛනවල (Literary Prose) යෙදුණු රචනා ස්වරූපය පමණි. මෙනිසා අනුරාධපුර යුගයට අයත් ගද්‍ය නිර්මාණ වශයෙන් දැනට විද්‍යමාන ධම්පියා අටුවා ගැටපදය, සිඛවළඳ හා සිඛවළඳ විනිස, හෙරණසිඛ හා හෙරණසික විනිස යන ගද්‍ය නිර්මාණ සහ ධම්පියා අටුවා ගැටපදයෙන් හමුවන හෙළටුවා පාඨ, සීගිරි කැටපත් පවුරේ තිබී මැතක දී සොයාගත් ගද්‍ය පාඨවලට පමණක් මෙම අධ්‍යයනය සීමා

වේ. සෙල්ලිපි පාඨ සාහිත්‍ය නිර්මාණ ගණයෙහි ලා නොසැලකෙන හෙයින් ඒවා හුදෙක් තුලනාත්මක වශයෙන් කරුණු දැක්විය යුතු අවස්ථාවල දී පමණක් යොදා ගැනේ. ඒ හැර සෙල්ලිපි රචනා රීති පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් කිරීම මෙම පර්යේෂණයේ දී සිදු නො වේ. සීගිරි ගී සහ සියබස්ලකර පද්‍ය ගණයෙහි ලා සැලකෙන හෙයින් මෙහි ලා උපයෝගී කර නො ගැනේ.

## පර්යේෂණ ක්‍රමවේදය

සාහිත්‍ය විමර්ශනාත්මක අධ්‍යයනයක් වන මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය ගුණාත්මක පර්යේෂණ (qualitative research) ක්‍රමවේදය යටතේ සිදු වේ. එහි දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ධම්පියා අටුවා ගැටපදය, සිඛවළඳ හා සිඛවළඳ විනිස, හෙරණසිඛ හා හෙරණසිඛ විනිස, ධම්පියා අටුවා ගැටපදයෙන් හමුවන හෙළටුවා පාඨ, සීගිරි කැටපත් පවුරේ එන ගද්‍ය පාඨ ද ද්විතීයික මූලාශ්‍රය වශයෙන් මෙම මාතෘකාව හා බැඳි ශාස්ත්‍රීය කෘති සහ ලිපි ද දත්ත රැස් කිරීමට උපයෝගී කර ගැනේ.

## සෛද්ධාන්තික රාමුව

මෙම පර්යේෂණය රචනා රීති අධ්‍යයනය හා සම්බන්ධ වූවක් බැවින් රීති විචාරය (Stylistics) හෙවත් රචනා රීති පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනය, සෛද්ධාන්තික රාමුව වශයෙන් යොදා ගැනේ

## සාහිත්‍ය විමර්ශනය

සිංහල ගද්‍ය සාහිත්‍යයේ ආරම්භක අවධියේ හෙවත් අනුරාධපුර අවධියේ ගද්‍යකරණය සම්බන්ධයෙන් දැනට විද්‍යාමන සාධක පවතින්නේ ඉතා අල්ප වශයෙනි. එයින් ද 10වන සියවසට පෙර අවධිය සම්බන්ධ සාධක ලෙස හමු වන්නේ ධම්පියා අටුවා ගැටපද කතුවරයා යම් යම් අවස්ථාවල දී උපුටා දක්වන ලද හෙළටුවා පාඨ කිහිපය, සීගිරි කැටපත් පවුරේ තිබී මෑතක දී සොයා ගන්නා ලද ගද්‍ය පාඨ කිහිපය පමණි. හෙළටුවා පාඨ පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී යක්කඩුවේ ප්‍රඥාරාම හිමිගේ 'පාලියේ හා සිංහලයේ

විකාශය' යන ශාස්ත්‍රීය ලිපිය ඉතා වැදගත් ය. මෙහි දී උන්වහන්සේ ධම්පියා අටුවා ගැටපදයේ හමුවන හෙළටුවා පාඨ හතක් පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් සිදු කරති. බෙනිල් ප්‍රියංක සීගිරි කැටපත් පවුර සම්බන්ධයෙන් 'සීගිරි කැටපත් පවුරෙහි තිබී මෑතක දී කියවන ලද කුරුටු ගී සහ ලේඛන' මෑතක දී කළ පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙස නව සීගිරි ගී බොහෝමයක් සහ ගද්‍ය පාඨ යැයි සැලකිය හැකි පාඨ 150ක් හෙළිදරව් කරගෙන ඇත. හෙළටුවා පාඨවලට පසුව ධම්පියා අටුවා ගැටපදයට පෙර හමුවන ගද්‍ය නිර්මාණ වශයෙන් දක්නට ලැබෙන එක ම මූලාශ්‍රය මෙම ගද්‍ය පාඨ හෙයින් මෙම කෘතිය මෙහි ලා ඉතා වැදගත් ය. සිංහල ගද්‍ය රීතිය පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමේ දී මූලික වශයෙන් වැදගත් වූ මූලාශ්‍රයන් කිහිපයකි. පළමු වැන්න සරච්චන්ද්‍ර වික්‍රමසූරිය The Sri Lankan Journal of the Humanities (**vol. viii**) ශාස්ත්‍රීය සංග්‍රහයට "The Classical Sinhalese Prose: Its themes, conventions and Prose Style" නමින් සපයන ශාස්ත්‍රීය ලිපිය යි. කතුවරයා මෙහි දී සිංහල ගද්‍ය සාහිත්‍යය ආරම්භයේ පටන් 18වන සියවස දක්වා රචනා වූ ගද්‍ය නිර්මාණ පිළිබඳ සැලකිලිමත් වෙමින් රචනා රීති පහක් පිළිබඳ සාකච්ඡා කරයි. දෙවන මූලාශ්‍රය ජේම්සි ද අල්විස් The Sidat Sangarava: A Grammar of the Sinhala Language ග්‍රන්ථයේ දී කරන ප්‍රස්තාවනාව යි. මෙහි දී අල්විස් සිංහල ගද්‍ය සාහිත්‍යය පාදක කර ගනිමින් රචනා රීති හතරක් ඉදිරිපත් කරයි. බඹරැන්දේ සිරිසීවලී හිමිගේ 'සිංහල ශෛලිය' කෘතිය ද මෙම පර්යේෂණයේ දී වැදගත් වූයේ සිංහල සාහිත්‍යයේ හමුවන විවිධ රචනා ශෛලීන් 14ක් සම්බන්ධයෙන් විග්‍රහාත්මක විවරණයක් එයින් ඉදිරිපත් වන බැවිනි. මෙම පර්යේෂණයේ න්‍යායික පදනම සැකසෙන්නේ රීති විචාරය (Stylistics) ඔස්සේ ය. මෙනිසා එහි මූලික සංකල්ප හඳුනා ගැනීමේ දී I R Galperin විසින් රචිත Stylistics කෘතිය ඉතා වැදගත් විය.

**හැඳින්වීම**

සිංහල ගද්‍ය සාහිත්‍යයේ ආරම්භය පිළිබඳ නිශ්චිත දින වකවානු ඉදිරිපත් කිරීම සුකර කාර්යයක් නො වේ. විජය රජු දවස පටන් ලේඛන කටයුතු සිදු වූ බවට සාධක පවතින (**ඌනපූරණසහිතො මහාවංසො, 1959: 8.3**) හෙයින් සාහිත්‍යකරණය ද පවතින්නට ඇතැයි කාල්පනික

නිගමනයකට පැමිණිය හැකි වුව ද එය නිශ්චිත ව තහවුරු කළ නො හැකි ය. සිංහල ගද්‍යයේ ආරම්භය පිළිබඳ අදහස් දක්වන මාර්ටින් වික්‍රමසිංහ (**2008**: **78**) ප්‍රකාශ කරන්නේ සීගිරි පද්‍ය හේතුවෙන් සිංහල පද්‍ය සාහිත්‍යයේ ඉතිහාසය 8 වන සියවස තෙක් දිව යන්නා සේ ම ශිලා ලිපි නිසා සිංහල ගද්‍ය සාහිත්‍යය ආරම්භය 8 වන සියවසටත් එපිටට ගමන් කරන බව යි. ක්‍රි. පූ. 1 වැනි සියවසේ පටන් බහුල ව සෙල්ලිපි ලියවී ඇති හෙයින් එයට සාපේක්ෂ ව ගද්‍යකරණයක් ද විය හැකි බව අනුමාන කරමින් මාර්ටින් වික්‍රමසිංහ මෙම අදහස දක්වා ඇත. ධම්පියා අටුවාවේ එන උද්ධෘතවලට අනුව සිංහල ගද්‍ය සාහිත්‍යයේ ප්‍රාරම්භක නිර්මාණ ලෙස දැනට සැලකිය හැකි වන්නේ හෙළටුවා ග්‍රන්ථ යි. මිහිඳු හිමියන් විසින් රැගෙන ආ පාලි අටුවා දීපවාසීන්ගේ හිත සුව පිණිස සිංහල භාෂාවට පරිවර්තනය වීමෙන් ඇති වූ ග්‍රන්ථ හෙළටුවා නමින් හැඳින් වේ. මෙම නිර්මාණ 10 වන සියවසේ දී පවා භාවිතයේ පැවති බව ධම්පියා අටුවා ගැටපදයේ දක්නට ඇති හෙළටුවා පාඨවලින් පැහැදිලි ය. එසේ වුව ද ක්‍රි.ව. 5වන සියවසේ දී බුද්ධඝෝෂ හිමි මෙම හෙළටුවා නැවත පාලියට පරිවර්තනය කිරීමෙන් පසු එම නිර්මාණ අභාවයට ගොස් තිබේ. එබැවින් වර්තමානයේ හෙළටුවා පිළිබඳ ඉතිරිව ඇත්තේ නාමික තොරතුරු පමණි. ඒ අනුව ඩී. ඊ. හෙට්ටිආරච්චි ධම්පියා අටුවා ගැටපදයේ දී (**2009**: **xiv-xv**) හෙළටුවා ග්‍රන්ථ 19ක් පිළිබඳ සඳහන් කරන අතර ඊ.ඩබ්ලිව්. අදිකාරම් (1963: 41) හෙළටුවා ග්‍රන්ථ 28ක නම් ඉදිරිපත් කරයි. මෙම නම්වලින් බුද්ධඝෝෂ හිමියන්ගේ අටුවා කෘතිවල සඳහන් වන්නේ මහා අට්ඨකථාව, කුරුන්දි අට්ඨකථාව සහ පච්චරිය අට්ඨකථාව යන හෙළටුවා ග්‍රන්ථ පමණි. මිහිඳු හිමියන්ගේ ප්‍රධානත්වයෙන් නිර්මාණය වූ සියලු හෙළටුවා මධ්‍යම ප්‍රමාණයේ ඇතුන් සත් දෙනෙකුගේ උසට පැවති බව සඳහන් වේ. (**ලොකුබණ්ඩාර, 2005**: 1). මෙයින් ප්‍රකට වන ප්‍රධාන කරුණක් වන්නේ ක්‍රි. පූ. 3 සියවස පමණ වන විට සිංහල ගද්‍යකරණය ඉතා උසස් මට්ටමක පැවති බව යි. මීට අමතර ව අනුරාධපුර යුගයේ දී රචනා වූයේ යැයි සැලකෙන සාහිත්‍ය නිර්මාණ රාශියක් පිළිබඳ විමල විජයසූරිය (1992:14-16) සහ පුංචිබණ්ඩාර සන්නස්ගල (1964:47-51) කරුණු දක්වන අතර මාදෝවිට ඤාණානන්ද හිමි (1963: 264-267) හෙළටුවා ද සමඟ අනුරාපුර යුගයේ දී රචනා වූ සාහිත්‍ය නිර්මාණ 64ක් පිළිබඳ තොරතුරු දක්ව යි. එම සාහිත්‍ය නිර්මාණ අතර ගද්‍ය

නිර්මාණ වශයෙන් නිශ්චිත ව හඳුනා ගත හැකි කෘති කිහිපයකි.

- සිංහල ථූපවංශය
- සිංහල බෝධිවංශය
- විසුද්ධිමග්ග සන්නය
- විසුද්ධිමග්ග සිලි සන්නය
- කුදුසික සන්නය
- විනය සන්නය
- විජම්අවතාර සන්නය

මෙම සාධක තහවුරු කරන්නේ අනුරාධපුර යුගයේ දී සිංහල ගද්‍ය සාහිත්‍යය ද පද්‍ය සාහිත්‍යයට සාපේක්ෂව දියුණු මට්ටමක පැවති බව යි. එහෙත් එම නිර්මාණවල අන්තර්ගතය පිළිබඳ තොරතුරු සඳහන් නොවන හෙයින් ඒවාහි භාවිත ගද්‍ය රීති පිළිබඳ කරුණු ඉදිරිපත් කළ නො හැකි ය.

විද්‍යමාන සාධක අනුව ඉපැරණිතම ගද්‍ය නිර්මාණය වන්නේ ධම්පියා අටුවා ගැටපද ය යි. ධම්මපදට්ඨකථාවේ එන දුරවබෝධ පදවලට ගැටපදයක් වශයෙන් අභාසලමෙවන් පස්වැනි කාශ්‍යප රජු අතින් රචනා වී ඇති මෙම කෘතිය සිංහල ගද්‍ය සාහිත්‍යයේ විද්‍යමාන පැරණිත ම කෘතිය වේ. සිංහලය ස්වාධීන භාෂාවක් බවට පත්වෙමින් පැවති කාලවකවානුවක රචනා වී ඇති මෙම කෘතිය සිංහල භාෂාවේ උපත, වැඩීම, ව්‍යාප්තිය, සංකලනය ආදි භාෂාව පිළිබඳ සැම වැදගත් කරුණක් ම විමසීමෙහි ලා ඉතා වැදගත් වේ. (**ධර්මකීර්ති, 2002: 40**). ධම්පියා අටුවාවට පසුව රචනා වූ කෘතියකි, සිඛවළඳ හා සිඛවළඳ විනිස. පාලි භාෂාවබෝධය නොමැති උපසම්පදාලාභී භික්ෂූන්ට අවශ්‍ය ශික්ෂාපද ඉදිරිපත් කිරීම මෙම කෘතියේ පරමාර්ථ ය යි. සිඛවළඳෙහි ඇතුළත් වන්නේ මාතිකා ස්වරූපයෙන් රචනා වී ඇති ශික්ෂා පද වන අතර එම ශික්ෂා පදවල විස්තර විභාග සිඛවළඳ විනිසෙහි සංග්‍රහ වී තිබේ. සිංහල භාෂාවේ මටසිලුටු බව හා සංක්ෂිප්ත බව මනාව

විදහා දැක්වෙන කෘතියකි, සිඛවළඳ හා සිඛවළඳ විනිස. අනුරාධපුර යුගයට අයත් අනෙක් විද්‍යමාන ගද්‍ය කෘතිය වන්නේ හෙරණසිඛ හා හෙරණසිඛ විනිස යි. උපසම්පදාලාභී භික්ෂූන්ගේ සුබවිහරණය පිණිස සිඛවළඳ හා සිඛවළඳ විනිස රචනා වූවා සේ ම සාමණේරයන් වහන්සේ විසින් හික්මිය යුතු ශික්ෂාපද සංග්‍රහ කරමින් හෙරණසිඛ රචනා වී ඇත. එම ශික්ෂාපදවල විස්තර කථනය හෙරණසිඛ විනිසෙහි ඇතුළත් ය. සිඛවළඳට සමාන ආකාරයෙන් රචනා වී ඇති හෙයින් මෙය ද සිඛවළඳ කතුවරයාගේ ම නිර්මාණයක් වන්නට ඇතැයි සැලකේ. (**රණසිංහ, 2014: 63**). මෙහි භාෂාව පිළිබඳ අදහස් දක්වන ආනන්ද කුලසූරිය (**1999: 121**) සරල භාෂාවෙන් රචනා වී ඇති ආදි නිර්මාණ අතර මෙය සුවිශේෂී වන බව පවස යි.

### විශ්ලේෂණය හා ප්‍රතිඵල

### ගද්‍ය රචනා රීතියේ ආදි ස්වරූපය හා වර්ධනය

පැරණි ඉන්දු ආර්ය වචනයක් වන රීති යන්නෙහි, අදහස් ප්‍රකාශ කරන ආකාරය, චරිතය, ක්‍රියා මාර්ගය වැනි අර්ථ සංග්‍රහ වේ. (**Etymological Lexicon of the Sinhala Language vol. 1, 2012: 227**). සාහිත්‍යකරණය සම්බන්ධයෙන් ගත් විට රීතිය යනුවෙන් අදහස් වන්නේ නිර්මාණකරුවෙකු අදහස් ඉදිරිපත් කිරීමට භාෂාව භාවිත කරන විලාශ ය යි. (**සුරවීර, 2005: 203**). A Dictionary of Literary Terms and Theory (**2013: 688**) කෘතියේ විස්තර වෙන ආකාරයට ගද්‍ය හෝ පද්‍ය නිර්මාණයක අදහස් ඉදිරිපත් කෙරෙන ආකාරයේ පවතින විශේෂතා (වචන, රචනෝපක්‍රම, වාක්‍ය බණ්ඩ ආදිය කතුවරයා භාවිත කර ඇති ආකාරය) ශෛලිය වේ. සාහිත්‍ය නිර්මාණයක ප්‍රධාන සංකල්පයක් ලෙස භාෂා රීතියේ වැදගත්කම අවධාරණය කළ වාමන "විශිෂ්ටා පදරචනා රීතිඃ" (**කාව්‍යාලංකාර සූත්‍ර වෘත්තිය, (පරි.) කුලසූරිය, 1962: 9**) වශයෙන් විශිෂ්ට වූ පදයන්ගේ එකතුවෙන් රීතිය නිර්මාණය වන බව දක්වී ය. භාෂා රීතියක් මෙලෙස විය යුතු යැයි දැක්වීමට නිර්ණායක නොමැති අතර ලේඛකයාගේ භාෂා ඥානය, සතතාභ්‍යාසය, සමාජ විඥානය අනුව භාෂා රීතිය සකස් වේ. කොටහේනේ පඤ්ඤාකිත්ති හිමි (**2000: 34**) අවධාරණය කරන පරිදි පර්වතයකින් ගලා හැලෙන දිය ධාරාවක් මෙන් භාෂා රීතිය

රචකයාගේ නෛසර්ගික ප්‍රතිභාව, සතතාභ්‍යාසය, රචනා කෞශල්‍යය අනුව නිර්මල ව, නිර්දෝෂ ව, නිරාකුල ව පහළ වේ. බඹරැන්දේ සිරිසීවලී හිමි (**2016: 15**) දක්ෂ ලේඛකයා දක්ෂ කෝකියෙකුට සමාන කර දක්ව යි. කෝකියා සිය හැකියාව අනුව නේක රසයෙන් යුත් ආහාර වර්ග නිපදවන්නා සේ ම නිපුණ ලේඛකයා සිය ශක්‍යතාව අනුව නේක රසවලින් යුක්ත ශෛලීන් නිර්මාණය කරන බව උන් වහන්සේගේ අදහස යි. රීතිය පිළිබඳ අපරදිග සිදු වූ විග්‍රහයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් වර්තමානය වන විට භාෂා රීති පිළිබඳ අධ්‍යයනය වාග්විද්‍යාත්මක ස්වරූපයක් ගෙන තිබෙන අතර ඒ සඳහා රීති විචාරය (Stylistics) නමින් වෙනම අධ්‍යයන ක්ෂේත්‍රයක් ද බිහි වී තිබේ. එහි දී සාහිත්‍ය නිර්මාණයක ශබ්ද, පද, වාක්කෝෂ සහ වාක්‍ය පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කෙරේ. (**A Dictionary of Literary Terms and Theory**, 2013: 88).

අනුරාධපුර යුගයේ පරිභාවිත ගද්‍ය භාෂා රීතියේ ස්වරූපය හඳුනා ගැනීමට පූර්වයෙන් අනුරාධපුර යුගයට අයත් කාල වකවානුව පිළිබඳ අවබෝධයක් ලබා ගත යුතු ය. සන්නස්ගලට (**1964: 12**) අනුව අනුරාධපුර යුගයට අයත් වන්නේ ක්‍රි. පූ. 437 - ක්‍රි. ව. 1058 අතර දක්වා වූ කාල පරිච්ඡේද ය යි. (**ආනන්ද කුලසූරිය, 1999: 6**) අනුරාධපුරය වශයෙන් සලකන්නේ ආරම්භයේ පටන් ක්‍රි.ව. 1017 දක්වා වූ කාල වකවානුව යි. අනුරාධපුර යුගයට අයත් කාලවකවානුව විශාල වුවද ගද්‍ය නිර්මාණ වශයෙන් දැනට ජීවමානව පවතින්නේ ධම්පියා අටුවා ගැටපදය, සිඛවළඳ හා සිඛවළඳ විනිස, හෙරණසික හා හෙරණසික විනිස සහ ධම්පියා අටුවා ගැටපදයේ සඳහන් හෙළටුවා පාඨ, මෑතකදී සීගිරි ගී අතර තිබී සොයාගත් ගද්‍ය පාඨ පමණි. මෙම සියලු සාධක විමර්ශනය කිරීමේ දී අනුරාධපුර යුගයේ භාවිත වූ භාෂා රීති සමස්තයක් වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය. එනම්, 10 වන සියවසට පෙර භාවිත වූ භාෂා රීතිය සහ 10 වන සියවසට පසුව භාවිත වූ භාෂා රීතිය වශයෙනි.

**ගද්‍ය රීතියේ මූලික ගතිලක්ෂණ (දහවන සිවසට පෙර භාවිත වූ ගද්‍ය භාෂා රීතිය)**

ධම්පියා අටුවා ගැටපදය රචනා වන 10වන සියවසට

(**සන්නස්ගල, 1964: 65, කුලසූරිය, 1999: 6**) පෙර ගද්‍ය සාහිත්‍යයක් පැවති බවට ධම්පියා අටුවාවේ එන හෙළටුවා පාඨ, සීගිරි ගද්‍ය පාඨ සාක්ෂි සපය යි. මෙම සාධක එම නිර්මාණවල රචනා රීති පිළිබඳ පරිපූර්ණ විග්‍රහයක් කිරීමට තරම් ප්‍රමාණවත් නො වුන ද එකී සාධක ක්‍රි. පූ. යුගයේ පටන් රචනා වූ සෙල්ලිපි සමඟ තුලනය කරමින් 10 වන සියවසට පූර්වයෙන් භාවිත ගද්‍ය රීතියේ ස්වරූපය දළ වශයෙන් හඳුනා ගැනීමට මෙහි දී තැත් කෙරේ. ධම්පියා අටුවා ගැටපදයේ සඳහන් වන හෙළටුවා පාඨ මෙසේ ය.

1. හෙළටුවායෙහි 'අප්පමාදම්හි පණ්ඩිතා භජෙථ යූහු. අපමා බැවුහි සෙවු ජෙනෙ. (79)

2. යොගෙ වදානකි, උපද්දාවාහි නමී'' මහඅටුවාහි කී බැවින්. (79)

3. 'සමාවතියා වත්ථුනාම පඨමං' යී මහඅටුවාහි ආ බැවින්. (80)

4. හෙළටුවායෙහි වෙරියෙක් විද මැරීය යෙත් (103)

5. උදන් අටුවායෙහි වැවක් නිසා වෙර බද් මිනිසෙක් යෙත් (103)

6. හෙළටුවායෙහි 'ප' යනු හැරැ ජෙතවාන මාරස්ස පුප්ඵකානි'යි පාඨ ගත්හු. ''මාරස්ස පුප්ඵකානීති සබ්බ අකුසලා'යී පුප්ඵක ශබ්දයෙන් අකුසල් කියූහු. (105)

7. හෙළටුවායෙහි සංවේපත් වැ දෙව්පිත් දහසක් දෙවුසරන් පිරිවරායි බුදුන් කරා ගියේයි. බුදුහු බණ කියූහ. බණ අසා දෙව්පිත් දිවසරන් හයි සැමැඟ සෝවාන් ඵෙලෙහි පිහිටි යයි කියා මතුයෙහි බික්සිඟිය ගමට් ආ මහණුන් පතිපූජිකාව පවත් ජැනැ නිවන් තැන් පුළුවුත් සේ කියූහු. (112)

8. දුවෙක් හිත්තිය ගෙහෙ මනුස්සානං පටිපුච්ඡිත්වා සත්ථාරහට් හිඳුන ආසන පැනවිහ යන හෙළටුවා හා සිමියෙයි. (115)

9. හෙළටුවායෙහි ඝන හත මට්ඨකය යෙත් (121)

10. දොර කවුළු ඇයි පැනෙන තාක් දැව වසා රන් කසුකම් කෙළේ යෙති මහඅටුවායෙහි (121)

11. නිබද්ධං අට්ඨකහාපණේ යී හෙළු අටුවායෙහි කියූ බැවින් (132)

12. හෙළටුවායෙහි යන්ත හක්කරක ලනක සිපැ යෙත්, ඇඟිලි අතුරෙන් අකුරු ලන සිපැයි යෙත්. (136)

13. ලකුණ්ටකොවදානිකි රස්ස නැමි'' යනු හෙළටුවායි. (148)

14. රහදෙ වදාන කිද ආවාටහි නමි'' හෙළු අටුවායෙහි (149)

වාක්කෝෂය පාලියට නෑකම් කියන්නකි. ඉහත පාඨවල එන ජෙනෙ, වදානකි, මාරස්ස, පුප්ඵෙ, ලකුණ්ටකො, රහදො, ආවාටහි, වත්ථු, පඨම යන වචන තත්භව හා තත්සම වශයෙන් නිර්මාණය වීමෙන් එය පැහැදිලි ය. මෙම වකවානුවේ සිංහල වාක්කෝෂය පාලියට සාම්‍ය වීම සාහිත්‍යකරණයේ දී පමණක් දැකගත හැකි ලක්ෂණයක් නොව ශිලාලිපිවල පවා දක්නට ලැබෙන්නකි.

"දමගුත තෙරහ ලෙණෙ අගත අනගත චතුදිස සගස" (**Inscription of Ceylon I. 1970 (5)**

මෙම ලිපිය පාලියට නැගූ විට 'ධම්මගුත්තස්ස ථෙරස්ස ලෙණං ආගතානාගත චතුද්දිස සංඝස්ස' යනුවෙන් සිටී. මෙම පාලි වාක්‍යය ඉහත සෙල්ලිපිය හා සංසන්දනය කිරීමේ දී වචන ස්තරය කෙතරම් පාලියට සමාන වන බව පැහැදිලි ය. පාලි තත්සම වදන් යෙදීම නිසා මාතෘ භාෂාගත වදන් හෙළ බසට බිඳීමේ දී සිදු වන මහප්‍රාණ අල්පප්‍රාණ විම, දීර්ඝාක්ෂර හ්‍රස්වවීම යන ශබ්ද විද්‍යාත්මක ලක්ෂණ හෙළටුවා පාඨවල දී වෙනස් වී ගිය ආකාරයක් දක්නට ලැබේ. හෙළටුවා වදන් අතර එන 'වදානකි' යන්න සිංහල පුරාණ සිංහල වචනයක් බවත් එය හෙළටුවා පාලියට පරිවර්තනය වීමේ දී එලෙසින් ම පාලි අටුවාවලට ප්‍රවේශ වී ඇති බවත් යක්කඩුවේ ප්‍රඥාරාම හිමියෝ පවසති. (**ප්‍රඥාරාම හිමි, 1983: 108**).

හෙළටුවා පද ස්තරයේ හමුවන ආධාර විභක්ති ප්‍රත්‍යයක් ලෙස 'හි' යෙදීම සහ ප්‍රථමා විභක්ති ප්‍රත්‍යයක් ලෙස 'එ' භාවිත වීම ප්‍රාකෘත ලක්‍ෂණයකි.(බලගල්ලේ, 2010: 49). 'හි' යන්න පාලි භාෂාගත සප්තමී විභක්ත්‍යාර්ථ 'ම්හි' යන්නෙන් බිඳී තිබේ.

'අප්පමාදහි'

'අවාටහි'

මාගධී ප්‍රාකෘතයේ ද දැක්වෙන පුරුෂ ලිංග සහ නපුංසක ලිංග ප්‍රථමා විභක්ති ඒකවචනය සඳහා යෙදෙන 'එ' ප්‍රත්‍ය එලෙසින් හෙළටුවාවල දැකගත හැකි බව යන වචන  සහ 'ජෙනෙ' වැනි වචනවලින් පැහැදිලි ය. මිහින්තලා ලෙන් ලිපිය, වෙස්සගිරි ලිපිය වැනි ක්‍රි. පූ. යුගයට අයත් ශිලා ලේඛනවල දක්නට ලැබෙන පුතෙ, ලෙණෙ, අබයෙ වැනි වචන විමසීමේ දී පැහැදිලි වන්නේ මෙම ලක්ෂණ සමකාලීන සෙල්ලිපිවල ද යෙදී ඇති බව යි. මෙවැනි ලක්ෂණ හේතුවෙන්, ගයිගර් (2013: 1) මුල්කාලීන සිංහලය අශෝක ප්‍රාකෘතය හා සාම්‍ය වන බව දක්වමින් ක්‍රි. පූ. 3 සියවසේ සිට 4 සියවස දක්වා වූ කාලවකවානුව සිංහල ප්‍රාකෘතය වශයෙන් සලක යි.

හෙළටුවා පාඨවල අන්තර්ගත වාක්‍ය ප්‍රස්තරය විමසීමේ දී පැහැදිලි වන්නේ මෙම කාලවකවානුවේ දී කෙටි වාක්‍ය රචනයට කතුවරුන් රුචිකත්වයක් දැක් වූ බව යි. විශේෂයෙන් ආඛ්‍යාත රහිත වාක්‍ය භාවිතය ඉතා ජනප්‍රිය රටාවක් බව පහත නිදසුන් විමසීමේ දී පැහැදිලි ය.

- අපමා බැව්හි සෙවු ජෙනෙ (අප්‍රමාදයෙහි පණ්ඩිත වූ ජනයායි)
- යොගෙ වදානකි, උපද්දාවාහි නමී (යෝග යන වචනය උපද්‍රවය නමකි)
- සමාවතියා වත්ථුනාම පඨමං (සාමාවතී වස්තුව පළමුවැන්නයි)
- ලකුණ්ටකොවදානකි රස්ස නැමි (ලකුණ්ඨක වචනය මිටි අරුතෙහි වේ)

- රහදෙ වදාන කිද ආවාටහි නමි (රහදො වචනය ගැඹුරු අර්ථ නමි)

ප්‍රාකෘත ලක්ෂණයක් වන ආඛ්‍යාත රහිත වාක්‍යවල වාක්‍යාවසානය සඳහා 'ඉ' ප්‍රත්‍ය භාවිතය ද හෙළටුවාවල දක්නට ලැබෙන බව (අබේකෝන්, 2005: 3) ඉහත සඳහන් වාක්‍යවල එන 'නමි, වදානකි' වැනි වචන සාක්ෂ්‍ය සපය යි. ආඛ්‍යාත සහිත වාක්‍යය ද භාවිත නො වූවා නො වේ.

සත්ථාරහට් හිඳුන ආසන පැනවිහ. (බුදුරජාණන් වහන්සේට හිඳ ගැනීමට ආසන පැනවූහ)

වෙරියෙක් විද මැරීය. (වෛරක්කාරයෙක් විද මැරීය)

හෙළටුවායෙහි සංවේපත් වැ දෙව්පිත් දහසක් දෙවුසරන් පිරිවරායි බුදුන් කරා ගියේයි. බුදුහු බණ කියූහ. බණ අසා දෙව්පිත් දිවසරන් හයි සැමැඟ සෝවාන් එලෙහි පිහිටි යයි කියා මතුයෙහි බික්සිඟිය ගමට් ආ මහණුන් පතිපූජිකාව පවත් ජැනැ නිවන් තැන් පුළුවුත් සේ කියූහු.

ආඛ්‍යාත රහිත බව සහ සහිත බව පිළිබඳ ඉහත නිගමන ඉදිරිපත් කළ හැක්කේ දැනට විද්‍යමාන පාඨවලිනි. එබැවින් එය සාකල්‍යයෙන් නිවැරදි නිගමනයක් නො වන බව කෙනෙකුට පෙනී යා හැකි වුව ද තත්කාලීන සෙල්ලිපි විමසීමේ දී එහි සත්‍යතාව තහවුරු කර ගත හැක.

පරුමක පලිකද පුත උපසක හරුමස ලෙණෙ චතුදිස ශගශ (**වෙස්සගිරි ලිපිය - Inscription of Ceylon I, 1970: 6**)

කෙඩාති ශෙන තෙරශ අතිවශික බත සුමන දත තෙරශ ලෙණෙ ශගශ (**මිහින්තලා ලිපිය - Inscription of Ceylon I, 1970: 1**)

පරුමක තිමර පුතශ පරුමක දිගගුතශ ලෙණෙ ශගශ (**ඔච්චප්පුකල්ලු ලිපිය - Inscription of Ceylon I, 1970: 9**)

අති අජරිය බතිය මත උපශික නගය (**තන්තිරිමලේ ලිපිය - Inscription of Ceylon I, 1970: 9**)

ඉහත ශිලාලේඛන ලියවී ඇත්තේ ආඛ්‍යාත රහිත වාක්‍ය වශයෙනි. ප්‍රාකෘත අවධියේ දී රචනා වන සෙල්ලිපිවල ද ක්‍රියාපද භාවිත නො වූ අතර ඒ වෙනුවට දිනෙ, නියතෙ, කරිතෙ වැනි අතීත කෘදන්ත පද යෙදිණි. (**මල්ලවාරච්චි, 2005: 30**). එබැවින් හෙළටුවා ග්‍රන්ථවල ද ක්‍රියාපද භාවිතය අඩු වන්නට ඇතැයි අනුමාන කළ හැක. සරල කෙටි වාක්‍ය යෝජනය හෙළටුවාවල පමණක් නො ව ක්‍රි. පූ. යුගයේ රචනා වූ සෙල්ලිපිවල ද හමුවන ගුණයකි.

පරුමක නග පුත අසලිය ලෙණෙ අගත අනගත චතුදිසික සගයෙ (**මිහින්තලේ ලිපිය - Inscription of Ceylon I, 1970: 2**)

බඩගරික පරුමක සෙනහ ලෙණෙ සගස (**රාජගිරිකන්ද ලිපිය - Inscription of Ceylon I, 1970: 5**)

බත ශුමනහ තල චඩි (**තන්තිරිමලේ ලිපිය - Inscription of Ceylon I, 1970: 9**)

පරුමක උපලි පුත පරුමක චටහ ලෙණෙ (ගල්කන්දේගම ලිපිය - Inscription of Ceylon I, 1970: 14)

පරුමක උතරි පුත දතස ලෙණෙ සගස (**කල්ලන්චිය ලිපිය - Inscription of Ceylon I, 1970: 15**)

සංක්ෂිප්ත ගුණය හෙළටුවා රීතියේ මූලික ලක්ෂණ ය යි. මෙනිසා උපමා රූපකාදී අලංකාර ප්‍රයෝග සහිත වර්ණනා රීතියක් එහි යෙදෙන්නට ඇතැයි සිතීමට දැනට හමුවන හෙළටුවා පාඨවලින් පිටුවහලක් නො ලැබෙයි. භාෂා රීතියේ වූ මෙම සංක්ෂිප්තතා ගුණය හෙළටුවාවලට පමණක් සීමා වූවක් නො ව අනුරාධපුර යුගයේ හමුවන සාහිත්‍ය කෘතිවල මෙන් ම ශිලා ලේඛනවල ද දක්නට ලැබෙන්නකි. මෙනිසා එය යුග රීති (period style) ලක්ෂණයකි. පොළොන්නරු යුගයේ සංස්කෘත ගද්‍ය සාහිත්‍යයේ ආභාසය ලැබෙන තෙක් සිංහල ගද්‍ය රීතියේ ප්‍රමුඛ ලක්ෂණය වූයේ මෙකී සංක්ෂිප්තතාව යි. පාලි භාෂාවේ බලපෑම මත මෙසේ කරුණු සංක්ෂිප්ත ව ඉදිරිපත් වූවා ද නොඑසේ නම් තත්කාලීන සිංහල ප්‍රාකෘතයේ ස්වරූපය හේතුවෙන් එසේ වූව ද යන්න පිළිබඳ නිගමනයට පැමිණීමට තරම් සාධක

නොමැති හෙයින් එකහෙළා ඒ පිළිබඳ තක්සේරුවකට පැමිණිය නො හැකි ය. එසේ වුවත් ගුරුළුගෝමී ධර්මප්‍රදීපිකාවේ ධාත්වාගමන කථා විස්තරයේ දී 'දායිමාළේ, දා නැගේ, ඉන්සේ ඉන්සේ, දා පුදායි මාළේ' යනුවෙන් පැරණි හෙළ වචන කිහිපයක් දක්වා එහි අර්ථ ද වෙන වෙන ම ඉදිරිපත් කරයි.

පුළුවුත් සඟනට දායි මාළේ' යි කීහ එහි මාළේ යනු මා අළියේ යැ යූ සෙ යි. ඉක්බිති දෙව් මිනිස්හු ගෙන නැඟි දාකරඬුව දැක 'දා නැඟෙ'යි තුෂ්ටරවයෙන් ගුගුළහ. හෙ 'ඉන් ශේෂයක් දෙන්නේ යැ' යූ සෙ යි. එක්බිති හෙරණපාණෝ රැස් වූ දෙව්මිනිස්නට 'දා පුදා යි මළෙ' යි කීහ. හෙ 'දා පුදව මා අළියෙ යැ' යූ සෙ යි. (**ධර්මප්‍රදීපිකාව, 2008: 407**)

මෙම විස්තරයෙන් ප්‍රකට කෙරෙන්නේ අදහස් සන්නිවේදනයෙහි ලා පැරණි සිංහල භාෂාවේ පැවති සමෘද්ධිමත් භාවය සහ එහි පැවති සංක්ෂිප්තතා ගුණ ය යි. එබැවින් සිංහල භාෂාව ආරම්භයේ පටන් ම සංක්ෂිප්ත මටසිලුටු භාෂාවක් වන්නට ඇති බව මෙවැනි කරුණුවලින් ප්‍රකට වේ. පාලි භාෂාවේ ආභාසය සමඟ එම තත්ත්වය වර්ධනය වන්නට ඇත.

හෙළටුවා පාඨවල සීමිත බව හේතුවෙන් එහි උපේත භාෂා රීතියේ ස්වරූපය පිළිබඳ ඉහත දැක් වූ කරුණු සීමා සහිත නිගමන වුව ද ශබ්ද, පද, වාක්‍ය යන සියලු අංශ අතින් ක්‍රි. පූ. යුගයේ රචනා වූ ශිලා ලේඛනවල ද සංක්ෂිප්ත රීතියක් භාවිත වන හෙයින් එය සාධනීය නිගමනයකි. මෙම යුගයේ ශිලා ලේඛනවල මූලික පරමාර්ථය වන්නේ කිසියම් පූජාවක් සිදු කළ බව දක්වමින් එම පූජාව කළ පුද්ගලයන්ගේ නම් ගොත් ආදිය ඉදිරිපත් කිරීම යි. එබැවින් එම ලේඛනවල වූ ඒකාකාරී ස්වරූපය (**මල්ලවාරච්චි, 2005: 30**), ලේඛන කාර්යයේ දුෂ්කරතාව, ලේඛන උපකරණයන්හි නොදියුණු බව (**පුෂ්පකුමාර, 2013, 210**) වැනි කරුණු ද සෙල්ලිපි රචනා රීතියේ සංක්ෂිප්තාවට හේතුවක් වන්නට ඇතැයි යන්න නොසැලකිය හැකි තත්ත්වයක් නො වේ.

සිංහල ගද්‍ය රීතියේ ප්‍රාරම්භක සලකුණු සොයා යාමේ දී සීගිරි ගී සම්බන්ධයෙන් 2020 වර්ෂයේ දී පළ වූ 'සීගිරි කැටපත් පවුරෙහි තිබී මෑතක දී කියවන ලද කුරුටු ගී සහ ලේඛන' යන පර්යේෂණය

ඉතා වැදගත් වේ. මෙහි දී කතුවරයා සීගිරි කැටපත් පවුරේ තිබී හමු වූ 8-10 සියවස්වලට අයත් ගද්‍ය පාඨ 150ක් ඉදිරිපත් කර ඇත. කතුවරයා ඉදිරිපත් කරුණු සත්‍ය නම් හෙළටුවා පාඨවලට පසුව සිංහල ගද්‍යකරණය සම්බන්ධයෙන් හමුවන පැරණිතම සාහිත්‍යික සාධක මෙම පාඨ එකතුව යි. කතුවරයා මෙම පාඨ, කාව්‍යාත්මක, අර්ධ කාව්‍යාත්මක සහ සාමාන්‍ය වශයෙන් ප්‍රධාන කොටස් තුනක් යටතේ සංග්‍රහ කරයි. (**ප්‍රියංක, 2020:73-78**). මෙම ගද්‍ය පාඨවල හමුවන භාෂා රීතියේ ස්වරූපය හඳුනා ගැනීමේ දී පළමුවෙන් එහි ශබ්ද සහ අක්ෂර සංවිධානය කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් ය. මෙම ගද්‍ය පාඨවල හමුවන භාෂාව සියබස හෙවත් හෙළ බස යි. මාතෘ භාෂාගත සංයුක්ත ව්‍යඤ්ජන කේවල වීම, කෙටි අකුරු භාවිතය, මහප්‍රාණ අක්ෂර අභාවිතය වැනි කරුණු නිසා හෙළ වදන්වල ශබ්ද සංස්ථිතිය ඉතා සරල වේ. මෙනිසා මෙම ගද්‍ය පාඨවල හමුවෙන වදන්වල අක්ෂර සහ ශබ්ද සංවිධානය ඉතා කෙටි වේ.

දනා මන තගෙ සිරිය සිතනන සිතෙ ත දසන (නුඹගේ රූපශ්‍රී හා දසුන නිසා සිතෙනා සිතුම්වලින් දන මන පිරී යයි.) - (**ප්‍රියංක, 2020: 75**).

ති වරලනි දිදුලෙහිය තල (නුඹගේ වරලසින් ගල් තලය දිදුලයි) - (**ප්‍රියංක, 2020: 75**).

හසුලුවැ චිති නල බතිමි මියෙද නමින පුදමෙ නිම (මියදෙමින් පවතින මෙම කාන්තාව නමින් (අපගේ) නිමල (සිතුවිලි) පුදමු.) - (**ප්‍රියංක, 2020: 75**).

කතුවරයා විසින් ගෙනහැර දක්වන ලද මෙම පාඨවල වදන්වල වර්ණ හතරකට වැඩි වදන් හමුවන්නේ අල්ප වශයෙනි. මෙම ගද්‍ය පාඨවල ශබ්ද පද්ධතියේ දක්නට ලැබෙන තවත් සුවිශේෂී ලක්ෂණයක් වන්නේ සුකෝමල ශබ්ද සංයෝජන ය යි. සංස්කෘත විචාරකයන් ශ්ලිෂ්ට ගුණය වශයෙන් දක්වන්නේ මෙම තත්ත්ව ය යි. එය මහප්‍රාණ අක්ෂර නො යොදා අල්පප්‍රාණ යෙදීමෙන් ඇති වන්නකි. හෙළ බස ස්වභාවයෙන් ම මහප්‍රාණවලින් තොර භාෂාවකි. මෙනිසා හෙළ බස යෙදෙන කවර අවස්ථාවක වුව ද මෙම සංලක්ෂණය නිරායාසයෙන් ම ඇති වේ. මීට අමතර ව පොදුවේ සීගිරි ගීවල හමුවන ශබ්ද විද්‍යාත්මක

සංලක්ෂණ කිහිපයක් ද මෙම පාඨවල දක්නට ලැබේ.

- ඇකාර භාවිතය

බැලි ගැ මිසවෙ දරත බො ජන ති මෙවන්ව (බැලීම් (නුඹ) ගෑ රුවක් නිසා ම බොහෝ ජනයාගේ පැමිණීම මෙසේ දරා සිටින්නීය.) - (**ප්‍රියංක, 2020: 74**).

- ව්‍යඤ්ජන හල් වීම

රසයා හොවුනෙවු ත දුටැය් හෙනෙ කතය් හගය් සිහිගිරි (රසයෙන් හොවා පවතින්නා වූ තා දුටු සඳ මෙම සිහිගිරියෙහි වියැකී යමින් සිටින්නා වූ කාන්තාව නුඹ බව හැඟී ගියේ ය.) (**ප්‍රියංක, 2020:** 73).

කුදුනා රියෙන් දල්මි උඩ් රජ්ගෙ තුල්වූ බැලීම් (කුඩා නාග රත්නදාඨ නැමැත්තා වෙමි. උඩරජගෙය තුළ වූ දේ බැලුවෙමි.) - (**ප්‍රියංක, 2020**: 78).

- සඤ්ඤකය වෙනුවට අර්ධ වර්ගාන්තය යෙදීම

බැලුමො මුකාන් පිටිපයි හිඳි ළයෙ මුළැයියන් (අපට පිටුපා සිටි ළය මුළා වූ ගොළු වූ කාන්තාවන් බැලුවෙමු.) - (**ප්‍රියංක, 2020:** 74).

සකි හිමිඳැයි තිවෙ දත පවතහු මතක පිදයයු (යෙහෙළිය නුඹගේ හිමියා විසින් නුඹව මෙහි ඇඳ ඇත්තේ මතුවටත් පවතිනු පිණිස ය. ප්‍රියාවිය නුඹ හිමියාගේ මතකය වෙනුවෙන් පූජා පවත්වනු.) - (ප්‍රියංක, 2020: 74).

- ද > ජ වීම

දකය් මෙළැයුහුය මෙ දිගැසියහි අජරයෙන (මෙම මිය යමින් පවතින දිගැසියන්ව ආදරයෙන් දැක බලමි) - (**ප්‍රියංක, 2020**: 78)

කතෙහියුනෙ ජැකැදැයි ගත රිසි මය විමි ගියය (සිගිරි කතුන් දකිද්දි මගේ ගත ඔවුනට රිසිවී ගියේ ය) - (**ප්‍රියංක, 2020**: 78).

මෙම සීගිරි ගද්‍ය පාඨ රචනා වී ඇත්තේ සිංහල භාෂාව ප්‍රාකෘත මට්ටමින් මිදී ස්වාධීන භාෂාවක් වශයෙන් සකස් වෙමින් පැවති අවධියක ය. මෙනිසා ඉහත සාකච්ඡා කළ ශබ්ද විද්‍යාත්මක ලක්ෂණ අතුරින් සඤ්ඤක වෙනුවට අර්ධ වර්ගාන්තාක්ෂර යෙදීම, මාතෘ භාෂාගත ජ කාරය ද කාර වීම සහ ව්‍යඤ්ජන හල් අකුරු යෙදීම වැනි ලක්ෂණ සීගිරි ගද්‍ය පාඨවලට ප්‍රවේශ වී ඇත්තේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

රචනා රීතියක් නිර්මාණය වීමේ දී ප්‍රධාන දායකත්වයක් ලැබෙන්නේ වාක් කෝෂයෙනි. සීගිරි ගද්‍ය පාඨ රචනා රීතිය මූලික වශයෙන් හෙළ වදන්වලින් පෝෂණය වූවකි.

සිහි තොප වෙ ළයෙ තොස රනවනය වෙය හැන්දිනය (නුඹව සිහිවෙයි. ළය තොස්වූ රන්වන් අඟන අපව හඳුනාගෙන මෙහි වෙයි.) - (**ප්‍රියංක, 2020: 73**).

සිතය බලද සලෙහි ඇදෙ දෙනටයු (ගලෙහි ඇඳි අය ගැන සිතා බලද්දී...) - (**ප්‍රියංක, 2020: 73**).

හිසිනි කිවද කතය වියි (හිසින් සන් කරන්නා වූ කාන්තාව විය) - (**ප්‍රියංක, 2020: 74**).

බැලු සිට තිගෙ සිතා සිහි (තිගේ සිත සහ සිහිය පිළිබඳ ව සිට බැලුවෙමි) - (**ප්‍රියංක, 2020: 74**).

මෙම ගද්‍ය පාඨ රචනා වන අවධිය වන විට සංස්කෘත භාෂා ආභාසය ප්‍රබලව ඉස්මතු වුව ද ස්වස්ති, ශ්‍රී යන වදන් හැරුණු විට සීගිරි ගද්‍ය පාඨවල සංස්කෘත තත්සම වදන් භාවිත නො වීම සුවිශේෂී කරුණකි. සීගිරි ගීවල මෙන් සීගිරි ගද්‍ය පාඨවල ද ප්‍රධාන වස්තු විෂය වී ඇත්තේ සීගිරි අප්සරාවන් ය. මෙනිසා ස්ත්‍රීය බැඳි වදන් බොහෝමයක් මෙම ගද්‍ය පාඨවලින් සොයා ගත හැකි ය.

කත (69) රන්වන (77) හිතැවතහ (99) කලු (127)

අගන (132) මීලැස් (223) පතිනිය (399) සිදැබුවහක (435)

පියවි (743) පියන් (745) මිනිදිබුව (779) සිදෙවියන් (754)

දිගස (6)

මීට අමතර ව සෑම ගද්‍ය පාඨකයක් ම පාහේ ප්‍රේමය, ශෘංගාරය, විරහව ආදි තේමා පාදක කරගෙන ඇති හෙයින් ඒ හා සබැඳි වදන්වලින් මෙම ගද්‍ය පාඨ පිරී ගොස් ඇත. සීගිරි ගද්‍ය පාඨ රීතියේ වාක්‍ය සංයෝජනය සරල වූවකි. කෙටි වදන් නිසා එකී සරල බව තවදුරටත් තීව්‍ර වී ඇත.

දිගස ත මන මය නමය්. (දිගු ඇස් ඇත්තිය නුඹ මගේ සිත නමා ගන්නීය.) - (**ප්‍රියංක, 2020**: 73).

හිසනි කිවද කතය වියි. (හිසින් සන් කරන්නා වූ කාන්තාව විය.) - (**ප්‍රියංක, 2020**: 74).

දැක සිටැ පැහැකෙව රුවිහ බලාගියෙ. (පැහැපත් වූ රුව දැක සිට බලා ගියෙ.) - (**ප්‍රියංක, 2020**: 74).

සිතක් මැදෙහි සිකි වි. (සිතක් මැදෙහි යෙහෙළිය සිටියාය.) - (**ප්‍රියංක, 2020**: 74).

තබුරු මල් තිවැ දළ පතිනි විනි. (තඹුරු මල් තබාගෙන දැඩිවූ පතිනිය විය.) - (**ප්‍රියංක, 2020**: 74).

ත හිසිහියි නිසෙලයසි ති දිස. (සන්සුන් වූ හිසින් යුක්තව නුඹව දිස්විය.) - (**ප්‍රියංක, 2020**: 75).

ආඛ්‍යාත ස්ථානයේ නාමයක් යෙදීමෙන් වාක්‍යාවසාන කිරීමේ රටාව හෙවත් නාමාඛ්‍යාත යෙදීමේ ලක්ෂණය ද විටින් විට මෙම ගද්‍ය පාඨවලින් හමු වේ. මෙම රටාව බහුලව යෙදෙන්නේ ප්‍රධාන ගද්‍ය පාඨයට පූර්වයෙන් එහි රචකයා කවුරුන් ද යන්න දැක්වෙන අවස්ථාවල දී ය.

සුරු අග්බොයිමි (**ප්‍රියංක, 2020**: 73).

සීගිරි ගීවලට සාපේක්ෂ ව සීගිරි ගද්‍ය රචකයන් අලංකාර

භාවිතයට වැඩි අවධානයක් යොමු කර නැත. එසේ වුව ද අවශ්‍ය තැන උචිත පරිදි උපමා ආදි අලංකාර භාවිතයට කතුවරයන් සතුව උසස් පරිකල්පන ශක්තියක් පැවති බව පහත නිදසුන්වලින් පැහැදිලි වේ.

සිරිහස් ළ සදිසි දුටි සලතල හැගෙයි සිහිගිරි. (ශ්‍රියාවන්ත හංසයෙක් බඳුව ඇය සීගිරි ගල් තලයෙහි සිටිනා බව ඇය දුටු මට හැඟෙයි.) - (**ප්‍රියංක, 2020: 73**).

පියැමුයු තම්බුරෙය හෙවැම්වෙනි සෙයකහි පිනා ගන කොට් (තඹුරු පියුමක් සේ ඇය හෙවී සිටිනා ආකාරය සිත පිනා ගන්වද්දී) - (**ප්‍රියංක, 2020: 75**).

ලැබයහි හඳ් වැව එය්නද හමුය හෙයුයාය් මෙසේය්. (වැවට හඳ පායා එනු ලැබුවාක් මෙන් (ඇයව) හමුවීම ද එසේ ම ය.) - (**ප්‍රියංක, 2020: 74**).

අම මහ බව ත මෙ (මහා අමාවක් බඳුව නුඹ මෙම...) - (**ප්‍රියංක, 2020: 74**).

සරසවි බැලු පන්සිලු අගනො බැලූ. (සරසවි බැලුවෙමු. පන්සිළු අඟනන් බැලුවෙමු.) - (**ප්‍රියංක, 2020: 73**).

සීගිරි ගද්‍ය පාඨ රචකයන් අර්ථ මාධූර්යය මෙන් ම ශබ්ද මාධූර්ය කෙරෙහි ද යම් අවධානයක් යොමු කර ඇති බව ගද්‍ය පාඨ අතර හමුවන අනුප්‍රාසාත්මක ව බස හැසිර වූ අවස්ථාවලින් ප්‍රත්‍යක්ෂ වේ.

දිගස ත මන මය නමය් (**ප්‍රියංක, 2020: 73**).

පා නෙත තිරයි දෙයයිනි ප නෙත එය එනනය (**ප්‍රියංක, 2020: 73**).

කෙන සුදනක රකනග් (කල්) තිට තියුයු සුය නෙතයක (**ප්‍රියංක, 2020: 73**).

අනුප්‍රාසය ජනිත වන්නේ සමාන අක්ෂර, ශබ්ද හෝ පද සමීපස්ථානයේ පිහිටුවීමෙනි. ඉහත ගද්‍ය පාඨ අතුරින් පළමුවැන්නෙහි මකාර සහ නකාර සුසංයෝගයෙන් ද දෙවැන්නෙහි ප, ත, න යන ශබ්ද සම්මිශ්‍රණයෙන් ද අවසාන පාඨයේ දී ස, ක, ත, ය ශබ්ද සුසමාහිතයෙන් ද අපූර්ව ශබ්ද රසයක් මවා තිබේ. සමස්තයක් ලෙස ගෙන සැලකීමේ දී සීගිරි ගද්‍ය පාඨ රචකයන් සීගිරි ගී රචකයන් මෙන් වර්ණනාත්මක ව රචනා රීතිය හසුරුවා නොමැති වුව ද ශබ්ද, පද සහ වාක්‍ය යන මූලික සංස්ථික ලක්ෂණවලින් සීගිරි ගද්‍ය පාඨවල සහ ගීවල හමුවන භාෂා රීතියේ කැපී පෙනෙන වෙනස් හමු නො වේ.

හෙළටුවා සහ ධම්පියා අටුවා ගැටපදය අතර වර්ෂ 1200ක් පමණ කාලපරිච්ඡේදය තුළ ගද්‍ය සාහිත්‍යය වශයෙන් සැලකීමට සීගිරි පාඨ හැරුණු විට කිසිදු මූලාශ්‍රයක් හමු නො වේ. මෙනිසා මෙම කාලවකවානුවේ ගද්‍ය රචනා රීතියේ ස්වරූපය අධ්‍යයනය කිරීමට සිදුවන්නේ සෙල්ලිපි ආශ්‍රයෙනි. සෙල්ලිපි නිර්මාණාත්මක ගද්‍ය ලේඛන වශයෙන් නොසැලකුව ද ගද්‍ය රචනා රීතියේ විකාශනය පිළිබඳ යම් තරමක වූ අවබෝධයක් ලබා ගැනීමට එයින් අවකාශයක් ලැබේ. ක්‍රි. පූ. යුගයට අයත් සෙල්ලිපිවල භාවිත වූ ගද්‍ය රීතියේ හමුවන සරල, සංක්ෂිප්ත ස්වභාවය ක්‍රි. ව. 3, 4 සියවසේ සිට අනුක්‍රමයෙන් වෙනස් වී ගිය ආකාරය පහත සෙල්ලිපි විමර්ශනයේ දී සුපැහැදිලි ය.

සිධ සි... කෙතහි කරිහක බොතිගම කෙතහි කරිහකෙ දිගසිව ගමකෙතහි කරිහක විහරවි කෙතහි කරහිකෙ දඩමකුල කෙතහි කරිහක උහරවි කෙතහි කරිහකෙ තුලතවි කෙතහි කරිහෙකෙ මහමකල කෙතහි කරිහිකෙ වනිජහකහි කෙතහි කරිහකෙ අචවිකෙතහි මහවි කෙතහි කරිහෙකෙ ලජකවිකෙතහි කරිහකෙ කබරජිතගම කෙතහි කරිහකෙ... - කිරලගල ශිලා ලිපිය, ක්‍රි.ව. 3 සියවස - (**Inscription of Ceylon II, Part II. 2001: 239)**

සිරි මෙක ජෙටතිස මහරජ අපයහ පුත බුදදස මහසෙන මහර...මහිලක ණකරක සුමනයහ පුත මහිලක ණකරක සිවයහ මකලක ණකරක...ජිත්‍ර කමල අබ කරවික ටබ සව සතනට පෙත අනුමොවතු මපුරුමකහට වෙඩ වයු. - රුවන්වැලි සෑ ටැම් ලිපිය, ක්‍රි.ව. 4 සියවස - (**Inscription of Ceylon III, 1933: 122)**

සිද්ධම් මපුරුමු බුදදස ළපරිදෙව මහරජ අපයහ අට බිසෙව රෙජන තිරිමහ ... සබරෙජෙන අචබලණ වලකය කදබ නමබර ........මෙ දෙ කරිභ කුබුර නව ඵම ච දුකුළ දස ච....ච....ල වහිරට දින. - බුද්ද පාරින්දගේ පුවරු ලිපිය, ක්‍රි.ව. 5 සියවස - (**Inscription of Ceylon IV, 1943: 114**)

සිද්ධම් මහ කුමරතස රජ අපයහ බමණගරිය වහෙරටය කෙණවි චඩ කොටු දිනක මහගරිය වෙව සර චෙ චුගරිය වෙව සර චෙ කබුබෙ වෙව සර චෙ කටචනක පුල සර චෙ වෙව චෙම චතර වෙව සර දක පෙත කඩය බෙජි පෙත බමණගරිය වහෙරෙ බි කසගහට චර පචයට දිනෙ... - නාගිරිකන්ද ගිරි ලිපිය, ක්‍රි.ව. 6 සියවස - (**Inscription of Ceylon Vol. IV. 1943: 123**)

සිථ කපකි සුමනයම් තුමහ අසනක දිවියඅතරඩක ච මහනබතපරිවනිය ච කවිසිපිටිනි ච මතකගමහි පති සකලක ච සමතය දකණවිහරහි දිගමපරිවන ජි නපඩසතරය නවම කරන කටි ඉච ඉතර මහපවටහි ඔවනක ඉච දළපතිසපුරුමකහ පචවනකහ දනිමි. - දක්ෂිණථූප ලිපිය, ක්‍රි.ව. 7 සියවස - (**Inscription of Ceylon Vol. V, Part I. 1955: 69**)

ස්වස්ති සෙන්හු වජනින් අරිත්තාරා වෙහෙර වැසි වත්හිමියනට් සතර් පස වැයුතු කරන කොට් ගල්හොය් දකුණ් තෙර්හි පිහිටි දිගැපිඩුල්ලේ අ සොරුයුර් පයල යි සා ලම්ජනවු .... යට්වැග කලල්වැලි සතර්පයල් යිසා වජාළෙයින් ලම්ජනවු වීරාංකුරාම් සිට් ලියැවීම් ස්වස්ති සිද්ධි... - රාස්සහෙල ගිරි ලිපි, ක්‍රි.ව. 8 සියවස - (**Inscription of Ceylon Vol. IV. 1943: 173**)

ස්වස්ති ඉසා සිරිසංබොය් මපුර්මුකා පළමුවන්නෙහි ඇසෙළැ අව දොළොස්වක් දවස් වත්හිමියන් මිහින්දල් මහාපාණන් වජාළෙයින් සිහිගිරි බිමැ අය්වූ සාගුණාපන්හලැ අබද්වූ තක් තැනට් දුනුමඬුල්ලන් රට්ලදු....යන් නොවද්නා ඉසා....නොවද්නා ඉසා....අවුල් නොකරනු ඉසා වත්හිමියන් මහාපාණන් වජාළෙයින් ආ මෙකාප්පර් කණ්ණාම් රාවණාම් හාත්පසැ සම්ජර්වන් එක්තැන් කොට් මෙ අත්තණිකණු හින්දවූම්හියි සිද්ධි. - වියඋල්පත ටැම් ලිපිය, 9 වන සියවස - (**Inscription of Ceylon Vol. IV. 1943: 17-179**)

මඟුල් සිහසුන් රක් ගල් තල අරය් වජන් බෙරසීනයේනේ රූපු වරණන් ඇඩිමඤ සිඳැ සී පැරැක්කමෙන් වැජැම්බැ අනත් අපිරිසෙය් සෙබා නිමල ගුණ වතුරෙන් ජියල් සනහස් සසුන් අරියු ලක්දිව් පොළොව මෙහෙසන පරපුරෙන් හිමි මපුරුම්... 10 වන සියවස - (**ශිලාලේඛන සංග්‍රහය** 1, 2000:28)

ආරම්භයේ පටන් ම ශිලාලේඛනවල වාක්කෝෂය සැකසී ඇත්තේ තත්භව වදන්වලිනි. 8, 9 සියවස්වල සිට තත්සම වචන භාවිතය අනුක්‍රමයෙන් වර්ධනීය ස්වරූපයක් සමස්තයක් වශයෙන් රචනා රීතියේ ස්වරූපය වෙනස් කිරීමට තරම් බලපෑමක් එයින් සිදු වී නොමැත. සෙල්ලිපි රචනා රීතිය විකාශනය වීමේ දී ප්‍රධාන වෙනස්කම් සිදු ව ඇත්තේ වාක්‍ය සංස්ථිතියට ය. ක්‍රි. පූ. යුගයට අයත් ලේඛනවල එන සරල කෙටි වාක්‍ය රටාවකි. එහි මූලික ආකෘතිය නාම විශේෂණය + ප්‍රධාන නාමය/අප්‍රධාන නාමය+ක්‍රියාව යන රටාවට අනුකූල වූවකි.

බත ශිවගුතහ ලෙණෙ චතු දිස ශගශ දිනෙ

එහෙත් මෙම තත්ත්වය ක්‍රි. ව. 3-4 සියවස්වල සිට ක්‍රමයෙන් වෙනස් ව ගොස් මූලික වාක්‍ය සංස්ථිතියේ ප්‍රධාන නාමයට අතිරේක නාම විශේෂණ දෙක තුනක් හෝ නාම විශේෂණ වාක්‍ය ඛණ්ඩ දෙක තුනක් එක්ව වාක්‍ය දීර්ඝ වී තිබේ. මෙම තත්ත්වය කෙතරම් වර්ධනය වී ගියේ ද යන්න 7, 8 සියවස්වල දී රචනා වන සෙල්ලිපිවල පේළි 9-10 සහිත දිගු වාක්‍ය යෙදී තිබීමෙන් පසක් කර ගත හැකි ය. දිගු වැකියක් සැකසීමේ දී සෙල්ලිපි රචකයන් අනුගමනය කර ඇති ක්‍රමවේද කිහිපයකි.

- ක්‍රියා වාක්‍යාංශයේ අප්‍රධාන නාමයට වාක්‍යාංශ එකතු කිරීම
- අවසාන ක්‍රියාවට පෙර පූර්වක්‍රියා යොදමින් වාක්‍ය ඛණ්ඩ කිහිපයක් යෙදීම
- ඒක කර්තෘක, අවසාන ක්‍රියාවක් සහිත වාක්‍යයක නාම එකක් හෝ වැඩි ගණන් නිපාතවලින් සම්බන්ධ කිරීම (**පුෂ්පකුමාර**, 2013: 219-225)

9-10 සියවස්වල රචනා වන සෙල්ලිපි රචනා රීතිය වර්ණනාත්මක ස්වරූපයක් ගැනීම රීතිමය වශයෙන් සිදු වූ විශාල පෙරළියකි. අභයගිරි පුවරු ලිපිය, මිහිඳු නම් ඈපා කෙනෙකු රුහුණේ කිරින්ද නම් ගමෙහි පිහිටුවන ලද සෙල්මුවා ටැම් ලිපිය, උදාමහයා නම් තැනැත්තෙකුගේ පුලියන්කුලම පුවරු ලිපිය වැනි ලිපි මේ සඳහා සුසමාදර්ශ සපය යි. ධර්මප්‍රදීපිකාව, බුත්සරණ කෘතිවල හමුවන ආකාරයේ කාව්‍යාත්මක වර්ණනා සිහිපත් කිරීමට තරම් උසස් කාව්‍යාත්මක ස්වරූපයකින් මෙම සෙල්ලිපි රචනා වී තිබේ. මීට අමතර ව ශබ්ද විචිත්‍රත්වය කෙරෙහි ද මෙකල සෙල්ලිපි රචකයක් විශේෂ අවධානය යොමු කර ඇති ආකාරය හතරවන මිහිඳු රජුගේ ජේතවනාරාම පුවරු ලිපිය, පස්වන මිහිඳු රජුගේ පොළොන්නරු ටැම් ලිපිය, උදාමහයාගේ පුලියන්කුලම පුවරු ලිපිය, කොන්ඩවට්ටවාන් ටැම් ලිපිය වැනි ලිපි අධ්‍යයනයේ දී පැහැදිලි ය. මෙම ලිපිවල එනම් ඇතැම් අවස්ථාවල පද සටනාව වෘත්තගන්ධි ශෛලියට ඉතා සමීප වන හෙයින් සිංහල වෘත්තගන්ධි ශෛලියේ මූලික අවස්ථා සහිත ලේඛන වශයෙන් ද මෙම ලිපි සැලකේ.

මෙම කරුණු තහවුරු කරන්නේ සෙල්ලිපි රචනය සරල, සංක්ෂිප්ත රචනා රීතියකින් ආරම්භ වුව ද අනුක්‍රමයෙන් එය සංකීර්ණත්වයට පත්ව වර්ණනාත්මක, කාව්‍යාත්මක වැනි රචනා රීති පවා සෙල්ලිපි රචනයේ දී යෙදී ඇති ආකාර ය යි. එහෙත් මෙවැනි රචනා විවිධත්වයක් ගද්‍ය සාහිත්‍යයෙන් හමු නො වේ. ක්‍රි. ව. 10 වන සියවසේ රචනා වන ධම්පියා අටුවා ගැටපදය, සිඛවළඳ හා සිඛවළඳ විනිස සහ හෙරණසිඛ හා හෙරණසිඛ විනිස යන කෘතිවල හමුවන්නේ ද හෙළටුවා සහ සීගිරි ගද්‍ය පාඨවල හමුවන සරල, කෙටි රීතිය යි. සෙල්ලිපි රචනා ක්‍රමය වර්ණනාත්මක, කාව්‍යාත්මක වශයෙන් විවිධ ස්වරූප ගැනීමට ප්‍රධාන බලපෑමක් කරන්නේ සංස්කෘත සාහිත්‍යාභාස ය යි. මෙම යුගයේ දී සංස්කෘත භාෂා සාහිත්‍යය සිංහලයට කළ බලපෑම කෙතරම් ද යන්න සියබස්ලකර කාව්‍යාදර්ශයේ අනුවර්තනයක් වශයෙන් රචනා වීම, සංස්කෘත බසින් සෙල්ලිපි රචනා වීම ආදියෙන් පැහැදිලි ය. එසේවුව ද සිංහල ගද්‍යය ආරම්භයේ පටන් ම පාලිය ආශ්‍රයෙන් වැඩුණු හෙයින් එහි රචනා රීතිය පාලි රටාවට අනුකූල ව සරල, සංක්ෂිප්ත රීතියක් ලෙස ගොඩනැඟී ඇත.

## ගද්‍ය රීතියේ අභිවර්ධනය (දහවන සිවසට පසු භාවිත වූ ගද්‍ය භාෂා රීතිය)

ක්‍රි. පූ. අවධියේ දී පටන් සකස් වෙමින් පැමිණි සිංහල භාෂාවේ වර්ධනීයතම අවස්ථාවක් ලෙස සියබස්ලකර රචනා වීම දැක්විය හැකි ය. දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය අනුව යමින් ස්වභාෂාවට උචිත අලංකාර පිළිබඳ විග්‍රහ කරමින් ක්‍රි. ව. 9වන සිවසේ දී රචනා වන මෙම කෘතිය පළමු සේන සලමෙවන් රජුගේ නිර්මාණයකි. මෙම කෘතියට පූර්වයෙන් සාහිත්‍ය නිර්මාණ පැවති බවට නාමික තොරතුරු සඳහන් වුව ද සිංහල සාහිත්‍යයේ දැනට විද්‍යමාන පැරණිතම කෘතිය සියබස්ලකර යි. මෙය අනුරාධපුර යුගයේ අගභාගය වන විට සිංහල සාහිත්‍යය සැම අංශයකින් ම ඉතා දියුණු තත්ත්යකට පත්ව තිබුණු බවට ප්‍රබලතම සාධකයකි. මෙම දියුණුව පද්‍යකරණය අංශයෙන් පමණක් නොව ගද්‍යකරණය අතින්ද වූ බව ධම්පියා අටුවා ගැටපදය, සිඛවළඳ හා සිඛවළඳ විනිස සහ හෙරණසික හා හෙරණසික විනිස වැනි ගද්‍ය නිර්මාණවලින් පසක් වේ. 10වන සියවසින් පසු ගද්‍ය රචනා රීතියේ ස්වභාවය හඳුනා ගැනීමේ දී මෙම ග්‍රන්ථවලින් ලැබෙන්නේ ඉමහත් දායකත්වයකි.

### ධම්පියා අටුවා ගැටපදයේ ගද්‍ය රීතිය

ධම්පියා අටුවා ගැටපදය පළමු ගද්‍ය නිර්මාණය වශයෙන් බොහෝ විචාකරයෝ සලකති. (**පඤ්ඤාකිත්ති හිමි, 1964: 154; රත්නපාල, 2009: 25; විතානගේ, 2002: 20; සද්ධාතිස්ස හිමි, 1958: 24; සෝරත හිමි, 1961: 34**). ධම්පියා අටුවා ගැටපදයට පූර්වයෙන් රචනා වූ කෘති විශාල ප්‍රමාණයක් පිළිබඳ නාමික විස්තර හමුවන හෙයින් මෙම කෘතිය රචනා වන විට සිංහලයේ ගද්‍ය රීතිය ග්‍රන්ථකරණයට උචිත අයුරින් සකස්ව පැවතුණි. ධම්පියා අටුවා ගැටපදයේ භාවිත භාෂා රීතිය පිළිබඳ විමසීමේ දී පැහැදිලි වන්නේ තමන් ඉදිරිපත් කරන කාරණාවේ ස්වභාවය අනුව භාෂා රීතිය සකසා ගැනීමට තරම් පස්වැනි කාශ්‍යප රජුගේ භාෂා ඥානය සුනිශ්චිත වූ බව යි. ධම්පියා අටුවාවේ පැනෙන භාෂා රීතිය පිළිබඳ අදහස් දක්වන කොටහේනේ පඤ්ඤාකිත්ති හිමියන් (1964: 112) ප්‍රකාශ කරන්නේ උසස් සාහිත්‍ය නිර්මාණයක දක්නට ලැබෙන කමනීය වාග්විලාසයක් ව්‍යාඛ්‍යාන

ග්‍රන්ථයකින් අපේක්ෂා කළ නො හැකි වුව ද කවිත්වයෙන් අනූන වූ බුද්ධියෙන් නිපුණ වූ භාෂාවෙහි ප්‍රවීණ වූ බහුශ්‍රැත පණ්ඩිතයකුට ව්‍යාඛ්‍යාන කෘතියක වුව ද උසස් රචනා ශෛලියක් යොදා ගත හැකි බව යි. පස්වැනි කාශ්‍යප රජු එවැන්නෙකු බව දක්වන උන්වහන්සේ ප්‍රකාශ කරන්නේ සරල, ඍජු, සුබෝධ වාග්විලාසයක් ගරු කරමින් ධම්පියා අටුවා ගැටපදය රචනා කර ඇති බව යි. (**පඤ්ඤාකිත්ති හිමි, 1964: 124**). ධම්පියා අටුවා ගැටපදයේ සුලභව දක්නට ලැබෙන්නේ පාලි රීතියට සමානව සැකසුණු කෙටි රීතියකි. පහත දක්නට ලැබෙන්නේ මේ සඳහා නිදසුන් ලෙස ගත හැකි අවස්ථා කිහිපයකි.

මර කිසෙයින් ආවට්ටන කෙරෙයි යත් ඇතැම්හු තොලගරහු සෙයින් වෙර බුමුසී යෙත්. ඇතැම්හු නොබිම්සැ මැ අවස්මර සෙයින් විකිරිය කැරැ යෙත්. ඇතැම්හු බිරම් රූ දක්වා සිත්සැති පෙරළා තුමා ඇටිඇටියෙහි වත්වා යෙත්. (**ධම්පියා අටුවා ගැටපදය, 2009: 69**).

තලකළු ඇයින් තල දඬු ඇතුළෙන් සිස් කොට යසුනු එයැ ගන්නා කල දඬු මුලට යවා දෙන කල දඬු අගට ඇරැ කිරනු තුලාකූට නම්. ආදි ගහණින් මානකූට කංසකූට ඇයි ගන්නේ...(**ධම්පියා අටුවා ගැටපදය, 2009: 80**).

රජ කස කරනු රජ කස කරනුයයි තුමන් දුන් පියලියෙහි යත් සුභ අරමුණෙහි පුරුදු සිත් ඇති තෙරනට ඉජිය අසොබ කම්ඨන් දුන සිත් කලමවයි. අසුභ කම්ඨන් නුදුන රාසිරි තෙරුන්ට ළෙහි රා නොසන්හිඳී. ඉති බැවින් විසුජ් පියලියෙන් සිත් හඹයි. කෙමෙන් කිලුටු පියලින් අසුබ් කම්ඨන් එරවැටිවැ පියලිකඩ දුන්හ. (**ධම්පියා අටුවා ගැටපදය, 2009: 82**).

දීර්ඝ සමාස විරහිත වීම, පාලි තත්භව වචන බහුල වීම, අල්පප්‍රාණ අක්ෂර සුලභ වීම මෙම භාෂා රීතියේ විශේෂ ලක්ෂණ වේ. මෙය ධම්පියාවට පමණක් විශේෂ වූ රීතියක් නොව සමකාලීන සෙල්ලිපිවල ද දක්නට ලැබෙන්නකි. කතුවරයා සමකාලීන සමාජ ව්‍යවහාර කෙරහි ද අවධානයක් දක්වමින් සිය කෘතියේ රචනා රීතිය සකස් කර ගත් බව එයින් පැහැදිලි ය. කෘතිය පුරා හමුවන තත්කාලීන සමාජයේ ව්‍යවහාර වූයේ යැයි සැලකිය හැකි, කුරුකුඹු, කොටනවා, තද අව්ව, බාන්, මීමුනුබුරු, මූකළ, සමන් කැකුළු, සින්නො, ළැම්ඩිය,

ළැහැබ, ළිප වැනි වචන රාශියක් අන්තර්ගත වීම එය තවදුරටත් තහවුරු කරන්නකි. ධම්පියා අටුවා ගැටපදය රචනා වන්නේ මධ්‍ය යුගයේ දී ය. මෙම යුගය වන විට සිංහල භාෂාව දියුණු වෙමින් පැවති භාෂාවක් විය. එබැවින් මෙම වකවානුවේ රචිත ලේඛනවල භාවිත භාෂාවේ නොසම ස්වරූපයක් පැවතිණි. ධම්පියා අටුවා ගැටපදයේ එම තත්ත්වය නොමදව ප්‍රකට වේ. (**කුලසූරිය, 1999: 85**). විකල්ප වචන භාවිතය, අන්ත හා මධ්‍ය ස්වර ලොප් වීම, මාතෘ භාෂාගත වචන සිංහලට බිඳීමේ දී ච-ජ වීම හා මහාප්‍රාණාක්ෂර ශේෂ වීම වැනි ලක්ෂණ ධම්පියා අටුවා ගැටපදයේ බහුල ව දක්නට ලැබේ. ඇතැම් පාලි වචන සිංහලයට බිඳී ඇත්තේ මටසිලුටු ස්වභාවයකින් නොවන බව පහත වචන විමසීමේ දී පැහැදිලි ය.

උපත්ථම්භ > උවථඹ

උක්ඛේපනීයකම්ම > උඛෙවුනීකම්

දිට්ඨධම්මෙ > දුටුධැම්යෙහි

පරියුට්ඨාන > පරියුඨන්

වික්ඛම්භන > විඛඹුන්

එසේ වුව ද පාලි වචන හා වාක්‍ය ඛණ්ඩ සුඛනම්‍ය ලෙස මෙන් ම අපූර්ව ලෙස බිඳ ගත් අවස්ථා ද කෘතියේ හිඟ නො වේ. පහත දැක්වෙන්නේ ඒ සඳහා දැක්විය හැකි නිදසුන් කිහිපයකි.

පිතුසිනෙහං - පියපෙම් (46)

තණ්ඩුල දෝණස්ස - සාල් තිඹක්හු (220)

සූපබ්‍යඤ්ජනෙන - හූ හා මාළියෙන් (224)

අනිත්ථිගන්ධ කුමාර නාම - ඉත්ථිගන්ධ නොසහන බැවින් අනිත්ථිගන්ධ නම් ලද කුමරහු (224)

වත්ථචුම්බටකෙන - පිළීසුඹුළුයෙන් (224)

අභිඤ්ඤාතෙ බ්‍රාහ්මණෙ - දෑ ගොතින් හා වෙදයෙන් පහළ බමුණන් (224)

මෙලෙස ඇතැම්විට මාතෘභාෂාගත වචන පරිවර්තනය කිරීමට ගැමි ජීවිතය හා සම්බන්ධ වදන් භාවිත කරන කතුවරයා තවත් විටක අනුප්‍රාසය වැනි ශබ්දාලංකාර ද යොදාගනිමින් වාක්‍ය ඛණ්ඩ පරිවර්තනය කරයි. එහෙත් එවැනි අවස්ථාවල දී භාෂාවේ වූ නොදියුණු ස්වභාවය සහ පාලි තත්සම පද බහුල වීම ආදි කරුණු හේතුවෙන් භාෂා රීතියේ සුබනම්‍ය, මටසිලුටු සහ ලාලිත්‍යමය ස්වරූපය ගිලි හී ගොස් කෘතිම ස්වරූපයක් එකතු වීමට හේතු වී තිබේ.

පඨමජ්ඣාන්හි පටා සමවැජා සමවන් ඣාන් විවස්මින් ආකිඤ්චඤ්ඤයින් පවා අවුජ් එ සමවැජා නැඟී කටයුතු තව්කිස නෙවසඤ්ඤානාසඤ්ඤා සමවැජා ඒ දෙවැටෙකින් නවතා සිත් අපවත් නිරොධ සමවැතට වනි. (**ධම්පියා අටුවා ගැටපදය, 2009: 43-44**).

අරිවස් පිළිවුවයෙන් එව්. ඉතිරීතර චීවරාදි සන්තොස හය් භාවනාරාමතා අරිවංස පටිපදා නම්. (**ධම්පියා අටුවා ගැටපදය, 2009: 46**).

කතුවරයා පඨමජ්ඣාන්, ආකිඤ්චඤ්ඤයින්, නෙවසඤ්ඤා නාසඤ්ඤා, නිරොධ, ඉතිරීතර, චීවරාදී, භාවනාරාමතා ආදි පාලි භාෂාගත පද සිංහලට පරිවර්තනය කර ඇත්තේ සිංහල විභක්ති ප්‍රත්‍ය පමණක් යෙදීමෙනි. එවැනි අවස්ථා කියවීමේ දී පාඨකයාට අමතර ආයාසයක් දැරීමට සිදුවීම නිසා භාෂා රීතියේ රමණීයත්වය හීන වී තිබේ. පස්වන කාශ්‍යප රජු භාෂාන්තර ඥානයෙන් පිරිපුන් ග්‍රන්ථ කර්තෘවරයකි. එබැවින් ඉහත ආකාරයේ දුර්වලතා පැවතිය ද කෘතිය පුරා උසස් ආකාරයෙන් රචනා රීතිය හැසිර වූ අවස්ථා සුලභව දක්නට ලැබේ. පහත දැක්වෙන්නේ ඒ සඳහා දැක්විය හැකි නිදසුන් කිහිපයකි.

හිරුරස් නොපහරුත් මේ මැටිපිඬි සත්කඬක් වැ පැළී. හිරුරස් නොපහරුත් මේ දියෙහි කුමුටුයෙන් මුඳුන් නොපැළී. කිබිසි සඳ නැඟි හිරුරස් පහරුත් මේ කුමට නොපැළි යැ? (ධම්පියා අටුවා ගැටපදය, 2009: 46).

සමබිම් පියෙහි පියෙහි ලැගෙන පියුම් විසිර රස් ප්‍රභාතයේ නො තප්න හිරු විරෙන මල්රොන් ඈ නොඑක් සුවෙන් උවෙළුවා ගමන් බුත්ලෙළහ නම් (ධම්පියා අටුවා ගැටපදය, 2009: 84).

හුදු හෙළ වහරට අනුගත වූ වචන සහිත, කෙටි වාක්‍යවලින් යුතුව සංක්ෂිප්ත ව නිර්මාණය වූ මෙම භාෂා රීතිය පසුකාලීන ව සුනිශිත ව වර්ධනය වී ග්‍රන්ථ පෝෂණයෙහි ලා නොමඳව දායක වූ බව සිඛවළඳ හා සිඛවළඳ විනිස, හෙරණසික හා හෙරණසික විනිස, අමාවතුර වැනි නිර්මාණ විමසීමේ දී පැහැදිලි ය.

ධම්පියා අටුවා ගැටපදයේ ප්‍රධාන භාෂා රීතිය පාලි රටාවට අනුගත වුව ද කතුවරයා අවස්ථාවට අනුකූලව අමතර භාෂා රීතීන් ද යොදා ගනී. ඒ අතර සංස්කෘත තත්සම හා තත්භව පද සහිත මිශ්‍ර සිංහල රීතිය ප්‍රධාන වේ. සිංහල ගද්‍ය සාහිත්‍යයට සංස්කෘත සාහිත්‍යයේ බලපෑම දැඩි වූයේ පොළොන්නරු යුගයේ දී වුව ද අනුරාධපුර යුගයේ පටන් ම එහි බලපෑම පැවති බවට මෙය මනා සාක්ෂියකි.

ස්වාර්ථ සම්පත්ති ගුණ හා පරාර්ථ ප්‍රතිපත්ති දෙගුණ කියූහ. ලොකන්තදස්සිනා ජලිතිද්ධිනා යනුයෙන් ස්වාර්ථසම්පත්ති ගුණ කියූහු. සද්ධම්මපජ්ජෝතො ජාලිතො යනුයෙන් පරාර්ථ ප්‍රතිපත්ති ගුණ කියූහු. දෙගුණෙන් බුදුන් ප්‍රණාමාරහ සේ දක්වා දැන් ප්‍රණාම කෙරෙති. (ධම්පියා අටුවා ගැටපදය, 2009: 2).

යම් තා දවස්හි ආශ්‍රවයනට පස නොවැ ආශ්‍රවයන් කෙරෙන් සිත් නොමුසී ද ඒ තා දවස් පලක් නොබිඳුනෙම් ය යොජනු. ආශ්‍රවයනට අරමුණු...(ධම්පියා අටුවා ගැටපදය, 2009: 37).

සංස්කෘත තත්සම පද බහුල ව යෙදෙන, කෙටි සමාස සහිත මෙම රීතිය සංස්කෘත ගද්‍ය රීති අතර එන චූර්ණික රීතිය සිහි කරව යි. මෙම රීතිය පොළොන්නරු යුගයේ දී ප්‍රධාන රචනා ක්‍රමයක් වුව ද ධම්පියා අටුවා ගැටපදයේ දී එය එතරම් ප්‍රබල ව ඉස්මතු නො වේ. මෙවැනි අවස්ථාවලින් ප්‍රකට වන්නේ කාශ්‍යප රජු පාලි, සිංහල පමණක් නො ව සංස්කෘත භාෂා ඥානයෙන් පවා සුපෝෂිත ඡේකකයකු බව යි.

යමක් අවබෝධ කර ගැනීමේ ඥානය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. එබැවින් ධම්පියා අටුවා ගැටපද කතුවරයා ද ඍජු ව කරුණු දැක්විය යුතු තැන සරල, සංක්ෂිප්ත භාෂා රීතියක් ද වර්ණනාත්මක ව කරුණු දැක්විය යුතු තැන කාව්‍යාත්මක භාෂා රීතියක් ද යොදා ගත්තේ ය.

කෙසකල්‍යාණ ඡවිකල්‍යාණ මංස කල්‍යාණ නහාරුකල්‍යාණ අට්ඨිකල්‍යාණ යැ යන මේ පස් කලණ ගුණ ඇති බැවින් ජනවියෙහි කලණ යන හුමන් ලදිය. කෙසලක්‍යාණ නම් කළු සිනිඳු සරල් කෙහෙ. ඡවිකල්‍යාණ නම් රන්වන් සිවි. මංස කල්‍යාණ නම් රත් අතුල් පතුල් ඔටස් මස් ඇ. නහාරුකල්‍යාණ නම් තඹ නිය පෙළ. අට්ඨිකල්‍යාණ නම් විදුරු පෙළ බඳු දත් පෙළ. (**ධම්පියා අටුවා ගැටපදය, 2009: 27**).

ඇතැම් අවස්ථාවල දී කතුවරයා වර්ණනාත්මක ගුණය තීව්‍ර කිරීමට කාව්‍යාලංකාර ද යොදා ගෙන තිබේ. කාව්‍යාලංකාර අතුරෙන් කතුවරයා දැඩි රුචියක් දක්වා ඇත්තේ උපමාවට ය. ඉදිරිපත් කෙරෙන කාරණාවට අදාළ ව ඖචිත්‍ය ගුණයෙන් පරිපූර්ණ උපමා යොදාගන්නා කතුවරයා එම උපමාවල දවටා ධර්ම කරුණු ඉදිරිපත් කරන්නේ දක්ෂ මාලාකරුවෙකු මෙනි. මෙනිසා ධම්පියාවේ එන මෙවැනි අවස්ථා සද්ධර්මරත්නාවලිය සිහි කරවන බව ආනන්ද කුලසූරිය ප්‍රකාශ කරයි. (**කුලසූරිය, 1999: 87**). පහත දැක්වෙන්නේ එවැනි අවස්ථාකි.

හුණු ළා කල් කිලිල් නම් වන සෙයින් පී මේ තුරුණු කල් 'පාමොජ්ජ' නම් වෙයි. කිලිල් මිහිකුරුණ හුණු නම් වන සෙයින් 'පාමොජ්ජ' මුහුකුළ 'පීති' නම් වේ. කම බලත් 'පාමොජ්ජ පීතිවද්ධනං' යී කියයුතුජ් අල්පාවතර බැවින් 'පීති' යනු පෙරට වී. (**ධම්පියා අටුවා ගැටපදය, 2009: 4-5**).

අර්ථාලංකාර මතු නො ව ශබ්දාලංකාර කෙරහි කතුවරයා තුළ වූ උනන්දුව පහත අනුප්‍රාසාත්මක නිදසුන්වලින් හෙළි වේ.

'උයන්කෙළි මල්කෙළි ඇයි කෙළියෙන් අසෝ කෙළියට නම්' (227)

'සෙසු සෙසුවනට පෙරටුපෙරටුවැ' (87)

'පිඬපස් පිළිලබ වස්' (124)

'කෙලෙස් බිහිලි බැවින් අවලි' (278)

ධම්පියා අටුවා ගැටපදයේ වාක්‍ය සංස්ථිතිය සමකාලීන සෙල්ලිපිවලට වඩා හාත්පසින් වෙනස් ලක්ෂණ දරයි. ප්‍රාකෘත යුගයේ දී ක්‍රියා පදයක් පවා නොමැති කෙටි වාක්‍යයකට දෙකකට සීමා වූ සෙල්ලිපි ලේඛනය 10 වන සියවස වන විට පේළි 10-12 ඉක්ම වූ වාක්‍ය බවට පත්ව තිබිණි. එහෙත් එම තත්ත්වය ගද්‍යයට ඉක්මණින් එකතු නො වූ බව ධම්පියා අටුවා ගැටපදය ඇතුලු මෙම යුගයේ රචනා වන සෙසු ගද්‍ය නිර්මාණ විමසීමේ දී පැහැදිලි ය. ධම්පියා අටුවා ගැටපදයේ බහුල ව දක්නට ලැබෙන්නේ කෙටි වාක්‍යවලින් සැකසුණු රීතියකි. එක් උක්තයකින් හා ආඛ්‍යාතයකින් යුක්ත, සම්පූර්ණ අදහස් ප්‍රකාශ කරන වාක්‍ය සරල වාක්‍යයකි. (**අභයසිංහ, 1990:20**).

පිළිසිඳසිත් මෙබ වඟසිත් වන බැවින් හේ පකති සිත් නම් වී. හේ අප්පදුට්ඨ නම් වෙයි. කෙලෙස් සපියො නැති වන බැවින්. කිරියමය සිත්හි කෙලෙස් සපියෝ ලදුයෙක් පදුට්ඨ වේ. සෙසු අප්පදුට්ඨ වේ. දැන් හැම සිත් අප්පදුට්ඨ සිත් හා ඒකත්තනයෙන් ගැණ... (**ධම්පියා අටුවා ගැටපදය, 2009**: 18).

ධම්පියා අටුවා ගැටපදයේ සරල වාක්‍ය සුලභ ව භාවිත වුව ද වාක්‍යයක යෙදෙන ඒකකවල ප්‍රමාණය විවිධකාර වේ. ඇතැම් අවස්ථාවල කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය ද ඇතැම් අවස්ථාවල දී උක්තය, උක්ත විශේෂණය, කර්මය, කර්ම විශේෂණය, ආඛ්‍යාතය, ආඛ්‍යාත විශේෂණය, ආඛ්‍යාත පූරණය, ආඛ්‍යාත පුරණ විශේෂණය යන සියලු ඒකක සහිත වාක්‍ය ද භාවිත වේ. කෙටි වැකිවලට අමතර ව දිගු වාක්‍ය යෙදුණු අවස්ථා ද කෘතියෙන් හමු වේ.

අනුන් යොවුන් වෙස් වරාජ් තුමන් මහජෙට වෙස් මැ ඇයට කල් සේ හඟවනුවට එව් අසුරන් යොවුන් වෙසජු සක්හු මහජෙට වෙස් නොඅගියි හැඟවියටි වැ එම් මහජෙට වෙස් සුජය ඇස් ගනුත් හඹයි, යොවුන් වෙස් කිවැනිය හොයි තුමන් රිව්හි වෙසෙස් හැඟවියටි වැ එව් මහජෙට මැවූහයි ගන්නේයි. (**ධම්පියා අටුවා ගැටපදය, 2009: 92**).

මෙලෙස දිගු වැකි යෙදුණු අවස්ථා හමුවන්නේ ඉතා අල්ප ව ය. කතුවරයා දිගු වැකි යෙදිය යුතු තැන ඒවා කෙටි වැකි සමග මිශ්‍ර කොට ඉදිරිපත් කරයි.

**සංවිධිත ගද්‍ය රීතියක නැගීම**

සිඛවළඳ හා සිඛවළඳ විනිස සහ හෙරණසිඛ හා හෙරණසිඛ විනිසෙහි හමුවන්නේ හෙළටුවාවලින් ඇරඹෙන සරල, සුගම ගද්‍ය රචනා රීතියේ දියුණුතම ස්වරූප ය යි. සිඛවළඳ හා හෙරණසික යන ග්‍රන්ථ දෙක ම රචනා වන්නේ පාලි මූලාශ්‍රයන් ආශ්‍රයෙනි. එසේ වුව ද ධම්පියා අටුවා ගැටපද කතුවරයාට වඩා සිඛවළඳ හා සිඛවළඳ විනිස සහ හෙරණසිඛ හා හෙරණසිඛ විනිස රචනා කළ ගත් කතුවරු පාලි මූලාශ්‍රයාගත කරුණු ළගන්නා ලෙස හෙළ බසින් ඉදිරිපත් කිරීමට සමත් වෙති.

යො පන භික්ඛූ ගාමා වා අරඤ්ඤා වා අදින්නං ථෙය්‍යසංඛාතං ආදියෙය්‍ය, යථාරූපෙ අදින්නාදානෙ රාජානො චොරං ගහෙත්වා හනෙය්‍යුං වා බන්ධෙය්‍යුං වා පබ්බාජෙය්‍යුං වා, චොරොසි බාලොසි මූළ්හොසි ථෙනොසී'ති, තථාරූපං භික්ඛු අදින්නං ආදියමානො අයම්පි පාරාජිකො හොති අසංවාසො'ති. **(පාරාජික පාලි, 2005: 102).**

ප්‍රාතිමොක්ෂයේ දැක්වෙන ඉහත අදින්නාදාන පාරාජිකාව සිඛවළඳ කතුවරයා දක්වා ඇත්තේ මෙසේ ය.

පරමිනිස්සතක්හු අයත් පල් පොහොනා වතක් සොරසිතින් ගත පරිජි වෙ. මෙ හැම අයිනාදන් පරිජි නම්. (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999:** 1)

ප්‍රාතිමෝක්ෂයේ එන අදහස මෙහි දී සිඛවළඳ කතුවරයා තවදුරටත් සංක්ෂිප්ත කරමින් දක්වන්නේ මූලික ශික්ෂා පදයේ එන අදහසට කිසිදු හානියක් නො කරමිනි. මූලික ශික්ෂා පදයේ සමස්ත අර්ථය 'පල් පොහොනා වතක්' යන වචන දෙකට සීමා කරමින් කරන ප්‍රකාශය සිඛවළඳ කතුවරයාගේ සියුම් බුද්ධිය මෙන් ම උසස් පරිවර්තන හැකියාව ප්‍රදර්ශනය කරන්නකි. එසේ ම සිය භාෂා රීතියට කිසිදු හානියක් නො වන පරිදි අරපිරිමැස්මෙන් වචන භාවිත

කිරීමට කතුවරයා සමත් ව ඇති ආකාරය ප්‍රශස්ත ය. හෙරණසිඛ හා හෙරණසිඛ විනිසෙහි හමුවන්නේ ද මෙම භාෂා රීතිය යි. ඉහත කාරණාව ම හෙරණසිකෙහි දක්වා ඇත්තේ මෙසේ ය.

දැනැ දැනැ දනා අයත් දා හු වැලයකුදු සොරසිතින් ගත පරිජී වෙ. (**හෙරණසිඛ හා හෙරණසිඛ විනිස, 1993: 1**)

මෙහි දී සමස්ත අර්ථය ම කතුවරයා 'දා හු වැලයකුදු' යන වචන කිහිපයට ලඝු කර දක්වා තිබේ. යොදාගත් භාෂා රීතිය ඉතා සංක්ෂිප්ත වුව ද රීතිවාදීන් දැක් වූ ගුණවලට අදාළ ව ගැඹුරු අදහසක් පැවතී ම, අර්ථයේ පැහැදිලි බව, ශෛලියේ මනා බද්ධතා ව, අදහස්වල සුගම බව, සිතෙහි සමාධිය ඇති වීම, විචිත්‍රවත් වීම, සුකෝමල වීම, ග්‍රාම්‍ය බවින් තොර වීම, අර්ථයේ තියුණු රසයක් ගැබ් වීම යන සියලු ගුණාංග ඉහත අවස්ථාවල ප්‍රමාණාතික්‍රාන්ත ව අඩංගු වේ. සිඛවළඳ සහ හෙරණසිඛ යන ග්‍රන්ථද්වයේ ම ශික්ෂාපද ඉදිරිපත් වන්නේ මතක තබා ගැනීමට පහසු පරිදි මාතිකා ස්වරූපයෙනි. මෙනිසා තේමාවට උචිත පරිදි රචනා රීතිය සකස් කර ගන්නා කතුවරු සංක්ෂිප්ත රීතියකින් කෘති සැරසූහ. ධම්පියා අටුවා ගැටපද රීතියට වඩා මෙම භාෂා රීතිය සංවිධිත වූවකි.

මියමින් සිටි දෙන කේල් නළ හුණු ආදි කළකුරුවා නම් දුකුළා ඇවැත් වේ. හිඟුරු ඉන්සලු නුග උාදී හිඳුවූ සඳ මුලුජු පතුජු දුන්නා කළකුරුවා නම් පිචිති ඇවැත් වේ. මුල් එව් පත් එව් දෙකිනෙකක් දුන් සඳ කළකුරුවා නම් දුකුළා ඇවැත් වේ. (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 52**)

ධම්පියා අටුවා ගැටපදයේ බහුල ව දක්නට ලැබෙන්නේ පාලි තත්සම හා අර්ධ තත්සම වචන සහිත පාලි රීතියට අනුව හැඩ ගැසුණු භාෂා රීතියකි. සිඛවළඳ සහ හෙරණසික උභය ග්‍රන්ථවල පාලි තත්සම හා තත්භව වචන භාවිත වුව ද එම වචන කාලයක් තිස්සේ ව්‍යවහාරයේ යෙදීම නිසා සුමට වී තිබේ. (**විජිත හිමි, 1964: 95**). එසේ ම පාලි රීතියට වහල් නො වී සිංහලයට උචිත ආකාරයෙන් සිඛවළඳ හා හෙරණසිඛ කතුවරු සිය භාෂා රීතිය සකසා ගත්හ. (**කාරියවසම්, 1965: 24**). මේ පිළිබඳ අදහස් දක්වන කොටහේනේ පඤ්ඤාකිත්ති හිමියන් (**1964: 21**) ප්‍රකාශ කරන්නේ ධම්පියා අටුවා ගැටපදය තත්සම

තද්භව වශයෙන් පාලි භාෂාවෙන් සිංහලයට ආ වචන නොසකස් වූ නොතැන්පත් වූ අවධියක කරන ලද බවත් සිඛවළඳ හා සිඛවළඳ විනිස භාෂ රීතිය තැන්පත් වූ අවධියක රචනා වී ඇති බවත් ය. මේ අනුව සිඛවළඳ හා සිඛවළඳ විනිස මෙන් ම හෙරණසිඛ හා හෙරණසිඛ විනිස කෘතිවල දක්නට ලැබෙන්නේ පෙර නො වූ භාෂා රීතියක් නො ව ධම්පියා අටුවා ගැටපදයේ භාවිත වූ භාෂා රීතියේ ම සංවිධිත ස්වරූපයකි. මෙම සංවිධිත බව ඇති වන්නේ පසුකාලීන ගද්‍ය නිර්මාණකරුවන් එම භාෂා රීතිය තළා පෙළා මටසිලුටු කර ගැනීමෙනි. (**ධර්මකීර්ති, 2002: 43**). දේශීයත්වයට උචිත ආකාරයෙන් නිර්මාණය වූ මෙම භාෂා රීතිය පිළිබඳ ප්‍රශංසාත්මක මුඛයෙන් කරුණු දක්වන මාර්ටින් වික්‍රමසිංහ (2016: 143, 181) ප්‍රකාශ කරන්නේ සිංහල භාෂාව ඉතා කමනීය භාෂාවක් බවත් එයට ආවේණික වූ විවිධ රචනා ශෛලීන් හෙවත් මෝස්තර පවතින බවත් සිඛවළඳ හා සිඛවළඳ විනිස, අමාවතුර යන ග්‍රන්ථවල උපයෝගී වන්නේ එවැනි මෝස්තර බවත් ය. එහෙත් පොළොන්නරු යුගයේ දී ඇති වන සංස්කෘත සාහිත්‍යයේ දැඩි බලපෑම මත මෙම රීතිය යටපත් වන අතර නැවත සද්ධර්මරත්නාවලියේ දී නව්‍ය ස්වරූපයකින් ඉස්මතු වුව ද එයට සංස්කෘත ගද්‍ය රීතීන් ඉක්මවා යාමට තරම් ශක්මත් නො වීය.

හෙළ බසෙහි ශබ්ද සංයෝජනය (phonological arrangemet) ස්වභාවයෙන් ම කෙටි ස්වරූපයක් දරන හෙයින් සිඛවළඳ, හෙරණසිඛ සහ ඒවාහි විනිස කෘතිවල හමුවන රචනා රීතියේ ශබ්ද සංවිධානය ඉතා සංක්ෂිප්ත ය. මෙනිසා තත්සම වචන හැර වර්ණ 5-6 සහිත වදන් මෙම කෘතිවල හමු නො වේ. රිද්මීයත්වයකින් කරුණු දැක්වීම ද මෙම රචනා රීතියේ ප්‍රකට තත්ත්වයකි.

බ පො නි ව උ න කෙළෙ

වෙ ඇ බි හි දු මැ නොකෙළෙ (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 20**)

යමක් කෙටියෙන් ඉදිරිපත් කිරීමට සිඛවළඳ කතුවරයා සතුව පැවති ප්‍රතිභාව ප්‍රදර්ශනය වන කදිම අවස්ථාවක් ලෙස මෙම උද්ධෘතය සැලකිය හැකි ය. පොහෝ කර්ම විස්තරයේ දී කරන මෙම විග්‍රහයේ දී බ පො නි ව උ න වෙ ඇ බි හි දු මැ යන අකුරු දොළහ

මගින් කතුරවයා සංක්ෂිප්තව දක්වා තිබෙන්නේ සිංහල ක්‍රමය අනුව මාස දොළහ හඳුන්වන නාමයන් ය. මෙවැනි උපක්‍රම යොදාගෙන ඇත්තේ මතක තබා ගැනීමට අපහසු කාරණා මතක තබා ගැනීමට ය. වර්තමානයේ පවා අධ්‍යයන කටයුතුවල දී මෙවැනි කෙටි ක්‍රම භාවිත කෙරේ. රිද්ම රටාවල (rhyme pattern) ශබ්ද සංයෝජනය සැම විට ම විවිධත්වයක් ගෙන තිබේ. මෙනිසා එයින් නැගෙන මාධූර්ය විචිත්‍රත්වයක් ගෙන ඇත.

තුන් ලොවට උතුම් රුවන්තියා කා විසි මුනි තුන් දොරින් සකසා වැඳ උපසපුව ලද පැවිජ්ජා පටන් හික්මියැයුතු සිරත්වරිත් සිබ සැබවින් කියනෙම්. (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 1**)

සිඛවළඳ ආරම්භයේ දී ම දැක්වෙන මෙම වාසගම් පාඨයෙහි නූතන නිසඳැස් කවියක හමුවන ආකාරයේ රිද්මීයත්වයක් අඩංගු වේ. මෙම පාඨය වර්තමාන නිසඳැස් ආකෘතිය අනුව මෙසේ දැක්විය හැකි ය.

තුන් ලොවට උතුම්

රුවන්තියා

කා විසි මුනි තුන් දොරින්

සකසා වැඳ

උපසපුව ලද පැවිජ්ජා පටන්

හික්මියැයුතු

සරිත්වරිත් සිබ

සැබවින් කියනෙම්

මෙවැනි රිද්ම රටා සිඛවළඳටත් වඩා හෙරණසිඛෙහි ඇතුළත් වන බව දක්වන චින්තක රණසිංහ (**2014: 64**) පවසන්නේ නූතන නිසඳැස් කාව්‍යවල පවතින ශබ්දයට වඩා අර්ථයට ප්‍රිය කරන ලක්ෂණ හෙරණසිඛෙහි ඇතුළත් භාෂා රීතියේ පවතින බවයි. එම අදහසේ

අසත්‍යයක් නො වන බව පහත උද්ධෘත විමසීමේ දී තහවුරු වේ.

බුදුරුවන්හි අයුණු කිව

ධමුරුවන්හි අයුණු කිව

සඟුරුවන්හි අයුණු කිව

පුවතත් මෙහෙණක හා ද

මෙවුන්ධම් සෙවිය

අනියත මිසදිට් ගත

යන මෙ පස සබ්බනාසනා නම් වෙ (**හෙරණසිඛ හා හෙරණසිඛ විනිස, 1993: 2**)

ඇතැම් අවස්ථාවල දී රිද්ම රටා මැවීමෙහි ලා කතුවරුන් යොදාගන්නේ අනුප්‍රාස ය යි. පහත දැක්වෙන්නේ එලෙස අනුප්‍රාසවත් ලෙස බස හැසිර වූ අවස්ථා කිහිපයකි.

අත් සිඳුනා පා සිඳුනා අත් පා සිඳුනා කන් සිඳුනා නාසා සිඳුනා කන්නාසා සිඳුනා ලදුවො ද... (**හෙරණසිඛ හා හෙරණසිඛ විනිස, 1993: 7**)

දුනමනා බද්දට කළමනාකමට...(**හෙරණසිඛ හා හෙරණසිඛ විනිස, 1993: 7**)

පකාපැකි පුවක් කඩ ආදී කපා වළඳත්...(**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 1**)

වඩුඅඟුලෙන් සතරඟුලෙන් බට අටඟුලෙන් දික් දැහිටි කා නම්. (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 8**)

නටනු ගනු වයනු බලනු අසනු යොදනු යොදවනු කෙරේ නම්. (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 8**)

හිඹුල් පුප් සමන් පුප් ආදී පුපුජු පුලුනුජු මිනිස් ලොම් නුමුසු

කමල්පතුජු මුහුණුමලාදී සුවඳ මලුජු තබා සෙසු හැම මල් හොත් බිහිජු බිම්බාහනජු වටී. (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 70**)

මෙවැනි අනුප්‍රාසාත්මක අවස්ථා බහුල ව ග්‍රන්ථද්වයේ ම දක්නට ලැබේ. රිද්ම මූලික ව කරුණු දැක්වීමට ප්‍රධාන හේතුව වන්නේ මෙම ග්‍රන්ථ දෙක ම ධාරණ-උද්ග්‍රහණ අරමුණු කර ගනිමින් රචනා වීමයි. සිඛවළඳ හා සිඛවළඳ විනිස, හෙරණසිඛ හා හෙරණසිඛ විනිස යන ග්‍රන්ථවල මූලික අරමුණ ශික්ෂාපද ඉදිරිපත් කිරීම සහ විස්තර කිරීම බැවින් ඒවාහි අලංකාර යෙදීමට ගත්කතුවරුන්ට එතරම් අවස්ථාවක් නො ලැබුණි. එමෙන් ම සංක්ෂිප්ත රීතිය අලංකාරාත්මක ව කරුණු දැක්වීමට මූලිකත්වයක් දෙන රචනා ක්‍රමයක් නො වේ. මෙනිසා මෙම ග්‍රන්ථ අලංකාරවලින් ආකූල වී නොමැත. අර්ථාලංකාරයක් ලෙස කතුවරුන් බහුල ව යොදා ගන්නේ උපමාව යි.

වට කොටැ කහබහන් බැඳැ පොරොනා සිවුරු ද පස්විකා ගෙනැ පත්පට ඇත්පිටැ බහාලූ ඇත්ගොච්චක් සේ...(**හෙරණසිඛ හා හෙරණසිඛ විනිස, 1993: 24**)

මොනර බිජුසේ මහත් නොකොටැ කිකිළි බිජු සේ කුඩා නො කොටැ...(**හෙරණසිඛ හා හෙරණසිඛ විනිස, 1993: 24**)

සුරුසුරු යන අනුකරණ ඇති නොකොටැ නොඋරා කබලගෙනැ මීයෙහි තුබූ කබල වඳුරන් සේ කොල්හි කැටි නොකොටැ...(හෙරණසිඛ හා හෙරණසිඛ විනිස, 1993: 25)

ඇතුපිටැ ලූ ගොටු සෙයින් දෙකෙළවරින් සමකොටැ...(**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 85**)

නොගිලන් වැ යම් කවරි දෙන තණ මුල් අතු ආදියැ පහරනා සේ සුළුදියටනු...(**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 91**)

ලකවළි සෙයින් වටා කුරුඳුමල්වැළ සෙයින් අවුණා පිට සිරුරු ගහන තැන පය ගහත් වටී. (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 68**)

ජීව භාෂාවක් වශයෙන් වැඩුණු සිංහල භාෂාවේ එක්තරා සන්දිස්ථානයක් ලෙස මෙම ග්‍රන්ථ ද්වයේ භාවිත භාෂා ව්‍යවහාරය දැක්විය හැකි ය. (**සිරිසුමන හිමි, 2009: 74**). එබැවින් එහි උපේත වාක්කෝෂය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. ප්‍රාතිමොක්ෂය, මූලසික්ඛා, සමන්තපාසාදිකා වැනි ග්‍රන්ථ ආශ්‍රය කර ගනිමින් රචිත සිඛවළඳ හා සිඛවළඳ විනිස සහ හෙරණසිඛ හා හෙරණසිඛ විනිස යන ග්‍රන්ථද්වයේ උපේත වන්නේ අනුවාදාත්මක ලක්ෂණ ය. එහි දී භික්ෂු විනය හා සම්බන්ධ වචන සඳහා සිංහලෙන් වචන නිර්මාණය කිරීම කමනීයවූත් සුබනම්‍යවූත් ආකාරයෙන් සිදු කිරීමට කතුවරුන් සමත්ව ඇති ආකාරය ග්‍රන්ථද්වයේ ම හමුවන වදන් විමසීමේ දී පැහැදිලි ය.

| | | |
|---|---|---|
| රතනත්තය | > | රුවන්තියා |
| කායවාචාමනො | > | කාවිසිමුනි |
| මග්ගත්තයෙ | > | මගතියායෙහි |
| උත්තරිමනුස්සධම්මා | > | උතුරුමිනිස්ධම් |
| සුක්ක | > | සුකුරු |
| මොචෙතුකාමචිත්තෙන | > | මිදියැටිසිතින් |
| දුට්ඨුල්ලවාචා | > | තුළුල් තෙපුල් |
| පාණාතිපාතා | > | පණිවා |
| මාලාගන්ධවිලෙපන | > | මල්ගඳවිලවුන් |
| පාරාජිකා | > | පරිජි |
| මෛථුනධම්ම | > | මෙවුන්ධම් |

කතුවරුන් දෙදෙනා සිංහල ඌරුව හා සාම්ප්‍රදාය රැකෙන පරිදි පාලි වචන සිංහලයට බිඳ ගෙන ඇති ආකාරය විචිත්‍රවත් ය. මෙම රචනා රීතිය මෙතරම් සුකෝමළ, සුලලිත වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ මෙසේ පද සිංහලයට බිඳ ගැනීමේ දී දැක් වූ ප්‍රතිභා

සම්පන්න ගුණ ය යි. එය ධම්පියා අටුවා ගැටපදයේ උපේත වචන සමඟ තුලනාත්මක ව විමසීමේ දී මනාව සුපැහැදිලි වේ.

| **පාලි වචනය** | **ධ.පි.අ.ගැ.** | **සිඛවළඳ හා සිඛවළඳ විනිස** |
|---|---|---|
| කච්ඡ | කිජිලි | කිසිලි |
| අනුච්ඡිත | නුසි | නිසි |
| නිස්සාය | නිසය | නිසා |
| අහං | අව් | මම |

ධම්පියා අටුවා ගැටපදයේ දක්නට ලැබෙන වාක්කෝෂය පාලියට බොහෝ සෙයින් ම සමාන වේ. සිඛවළඳ හා සිඛවළඳ විනිසෙහි ද පාලි තත්භව වචන පැවතිය ද එය සිංහල ව්‍යවහාරයට බෙහෙවින් සමාන වන හෙයින් එහි මනා තැන්පත් භාවයක් මෙන් ම ශාස්ත්‍රීය භාවයක් පවතී. අනුරාධපුර යුගයේ ව්‍යවහාර වූ නිවහල් භාෂා විලාසය සිඛවළඳ හා සිඛවළඳ විනිසෙන් දැක ගත හැකි වන්නේ මෙනිසා ය. (**සෝමානන්ද හිමි, 1961: 129**). ධම්පියා අටුවා ගැටපදයේ මෙන් නො ව මෙම කෘති දෙකේ දී ම පාලි තත්සම වශයෙන් යෙදුණු අවස්ථා හමු වන්නේ ඉතා දුලභ වශයෙනි. පහත දැක්වෙන්නේ එවැනි වචන කිහිපයකි.

| | | |
|---|---|---|
| විඤ්ඤූවක්හු | මඤ්ජෙට්ඨ | උජ්ඣාසනාසඤ්ඤා |
| උක්ඛිත්තකයා | උභතොබ්‍යකුජනකයා | ධඤ්ඤයනුදු |
| ඤත්ති | තිත්ථියපක්ඛන්තකයො | තිරච්ඡානයහයි |
| උභතොබ්‍යඤ්ජනකයො | | අලච්ඡින්නකයො |

මෙවැනි පද යෙදෙන බොහෝ අවස්ථාවල පාලි තත්සම වචනයට සිංහල ප්‍රත්‍ය එකතු කර ඇත. 10 වන සියවසේ සිට සංස්කෘත භාෂාව සිංහල භාෂාවට කළ බලපෑම කොතරම් ද යන්න මෙවක රචනා වන සෙල්ලිපි විමසීමේ දී පැහැදිලි ය. එහෙත් සිඛවළඳ හා සිඛවළඳ විනිසට සහ හෙරණසිඛ හා හෙරණසිඛ විනිසට එහි

බලපෑමක් සිදු වී නොමැත. කෘති දෙකෙහි ම සංස්කෘත තත්සම වචන ඇත්තේ අඩු ප්‍රමාණයකි.

| | | |
|---|---|---|
| ඍතු | පක්ෂය | මාත්‍රයකුදු |
| කායප්‍රසාද | කුලසංග්‍රහ | ලාභාශායෙන් |
| පූර්වකෘත්‍ය | පූර්වකරණ | කායප්‍රසාද |
| පූර්ව බැවින් | ශාස්ත්‍ර | ප්‍රකාරයෙන් |
| කුෂ්ඨ | චතුෂ්කය | ප්‍රශ්න |
| ශුද්ධ | බ්‍රහ්මාත්වභාවය | දුශ්චරිත |
| ග්‍රන්ථධුර | විදර්ශනාධුර | ක්ෂමා |

මෙවැනි වචන භාවිත වී ඇත්තේ තැනින් තැන බැවින් ධම්පියා අටුවාවේ මෙන් එයින් මිශ්‍ර සිංහල රීතියක් නිර්මාණය වී නොමැත. සිඛවළඳ හා සිඛවළඳ විනිස සහ හෙරණසිඛ හා හෙරණසිඛ විනිස යන කෘතිද්වයයේ ම ඇතැම් වචන පූර්ණ වශයෙන් පරිණාමයට පත්ව නොමැත. මෙනිසා ඇතැම් වදන් අර්ධ තත්සම ස්වරූපයක් දරයි.

අද්ධාන මග්ග > අධන් මග

කම්මපථ > කම්පථ

ධුරනික්ඛේප > ධුරනිකෙව්

සික්ඛා > සිඛ

පඨමජ්ඣාන > පඨමඣන්

උත්තරිමනුස්සධම්ම > උතුරුමිනිස්ධම්

සිඛවළඳ හා සිඛවළඳ විනිස සහ හෙරණසිඛ හා හෙරණසිඛ විනිස රචනා රීතියේ පවතින සුවිශේෂී ලක්ෂණයක් වන්නේ සාමාන්‍ය ජන ජීවිතය හා බද්ධ ගැමි වදන් යෙදී තිබීම යි. පහත දැක්වෙන්නේ එවැනි වදන් කිහිපයකි.

| | | | |
|---|---|---|---|
| අඳුන්දිවි | කටුඇට | ඉඳුල් | හිල්මස |
| හුණුදඬු | කොමුමුවා සිවුරු | කපුමුවා සිවුරු | තිහිරිමුවා සිවුරු |
| පලස්මුවා සිවුරු | සැණමුවා සිවුරු | අරළුපකක් | විරිවන්මිණි |
| සාල් | උඳු | මුගු | සිඟිවැල් |
| මුවවිට | තණඔලක් | සිද්දතුතෙල් | දඬුඑල්බෑ |
| මැස්සහ | මහබමර මැස්සහ | මිහි මැස්සහ | ලොහොගුළා |
| කහබහන් | පත්පට | බිසි කඩ | පත්කඩ |
| පාඅළු | පුවරුකඩ | කෙළමලා | බුමුතුරුණු |
| කෙටේරි | පොරෝ | උදළු | වේවැල් |

සිඛවළඳ විනිසෙහි භාවිත ඇතැම් වචන වර්තමාන ව්‍යවහාරයෙන් ගිළිහී ගොස් තිබෙන අතර එවැනි වචන පහදා ගත හැක්කේ සිඛවළඳ කියවීමෙන් පමණි.

සමරුවන් වන සිතින් - ශරීරය ස්පර්ශය විඳිනා කැමැත්තෙන්
පියවි ගෙය - කැසිකිළිය
ඔචස් ගෙය - වැසිකිළිය
නොරඹුරේ - රහස් ස්ථානය
ලිහිණිව - නග්නව

සිඛවළඳ හා සිඛවළඳ විනිස සහ හෙරණසිඛ හා හෙරණසිඛ විනිස භාෂා රීතීන්හි වාක්‍ය සංස්ථිතිය සැකසී ඇත්තේ කෙටි වාක්‍ය හා දිගු වාක්‍ය සංකලනයෙනි. එයින් ද සිඛවළඳ සහ හෙරණසිඛ යන කෘති දෙකෙහි කරුණු ඉදිරිපත් වන්නේ මාතිකා ස්වරූපයෙන් හෙයින් කෙටි වාක්‍ය රටාව බහුල ව යෙදේ.

උපසපන් පැවිජ්ජක්හු සස්නෙන් ගැලැවියටි සිත් ඇතියාවැ අනිකක්හු කිරීම් දැකැ එලෙස් ගෙනැ වැළැතැ සිටැ පරිජි වතින් සොයා එව් සොයවා එව් ඔහු එවිගස දත සඟවෙසෙස් වේ. මේ හැම අඤ්ඤභාගී සඟවෙසෙස් නම්. (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 3**)

වසකි කටැටිවැ මුසවා කිව මෙරමා දත පචිති වේ. (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 3)**

එක්සාලිස් පචිත්තෙහි සතරවන පදසොධම් සිඛය හා පස්වන සවන සහසෙයා සිඛය හා සත්වන මාගමට බණ කියන සිඛය හා...(**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 13)**

මෙම කෘතිවල හමුවන කෙටි වාක්‍ය රටාවේ පවතින සුවිශේෂී ලක්ෂණය වන්නේ සමාන්තරත්ව යයි (parallelism). එනම් සමීපයේ යෙදෙන වාක්‍ය කිහිපයක හෝ වාක්‍ය කොටසක ආකෘතික වශයෙන් දක්නට ලැබෙන සමානත්ව ය යි. (A Dictionary of Stylistics, 1990: 301-302).

බුදුරුවන්හි අයුණු කිව පරිජි වේ.

ධමුරුවන්හි අයුණු කිව පරිජි වේ. (**හෙරණසිඛ හා හෙරණසිඛ විනිස, විජිතනන්ද, 1993: 1).**

ඉහත උද්ධෘතයේ එන වාක්‍ය දෙකේ ම හමුවන්නේ සමාන ආකෘතියකි. එහි මූලික වාක්‍ය රටාව 'පරිජි වේ' යන්න වන අතර එයට 'බුදුරුවන්හි ය ධම්රුවන්හි අයුණු' යන පාද 'කිව' යන අසම්භාව්‍ය ක්‍රියාවෙන් සම්බන්ධ වී තිබේ. මෙලෙස වාක්‍ය දෙකෙහි ම දක්නට ලැබෙන්නේ සමාන ආකෘතික් හෙයින් සමාන්තරත්වයක් නිර්මාණය වී තිබේ. සංක්ෂිප්ත රීතිය බොහෝ උගතුන්ගේ ඇගයීමට පත් වීමට මෙලෙස විවිධ කෙටි වාක්‍ය රටා යෙදී ම ප්‍රධාන සාධකයක් විය. (**සේනානායක, 1982: 44**). සිඛවළඳ හා හෙරණසිඛ එන තොරතුරු විස්තර කරමින් රචිත සිඛවළඳ විනිස, හෙරණසිඛ විනිස යන කෘතිවල හමුවන්නේ කෙටි වාක්‍ය සහ දිගු වාක්‍ය සංකලනයෙන් සැකසුණු රචනා ශෛලියකි.

පළමු කී අගුණාංගයෙන් තොරවූ ගුණාංගයෙන් යුත් මහ පිනැ'තියක්හු මහණ වියටිවැ ආකල ධැමෙන් සෙමෙන් උපදනා පස ලබනසේද සිහිල් කැමත හුණු ලැබෙනසේ ද හුණු කැමත සිහිල් ලැබෙනසේද දිවිහිමයෙන් හුදකලාවැ හිඳිනා හෝනා එක්වේලේ වළඳනු බ්‍රම්සරවස් රක්නට උගහටසේද පළමු ඕ හට කියා මේ හැම කිසිවක් සේ... (**හෙරණසිඛ හා හෙරණසිඛ විනිස, 1993: 12)**

දිගු වාක්‍ය යෙදීමේ දී ඒ ඒ වාක්‍ය ඛණ්ඩ එකිනෙකට එකිනෙක සම්බන්ධ කිරීමට කතුවරුන් යොදාගෙන ඇත්තේ බහුසම්බන්ධක ය යි (polysyndeton). වාක්‍ය සම්බන්ධකවලින් වාක්‍ය, වාක්‍ය ඛණ්ඩ සහ වචන සම්බන්ධ කිරීම මෙහි ස්වරූප ය යි. ඉහත දිගු වාක්‍ය නිර්මාණය වීමේ දී සියලු වාක්‍යාංශ 'ද' නිපාතයෙන් එකිනෙකට සම්බන්ධ වී තිබේ. සිංහල භාෂාවේ වාක්‍ය සම්බන්ධක ලෙස යෙදෙන්නේ නිපාත, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, කෘදන්ත ආදිය යි.

■ 'සහ, හා, එව්, හෝ 'ආදි සමුච්චයකෘත නිපාතවලින් වාක්‍ය සම්බන්ධ කිරීම

හිවී ගිය මස් ඇත්තීයැ යි එව් මුසුවූ හදන් ඇත්තීයැ යි එව් දෙහදන් ඇත්තීයැයි එව් හවා නම් ඈ එව්ගස දත සඟවෙසෙස් වේ. **(සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 31).**

මෙම වාක්‍යයෙහි 'ඈ එව්ගස දත සඟවෙසෙස් වේ' යන ප්‍රධාන වාක්‍යයට සෙසු අන්තර් වාක්‍ය 'එව්' සංඛ්‍යාත නිපාතයෙන් බද්ධ වී ඇත.

■ පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා භාවිත කිරීම

ඇවැත් දෙසන සැඳැ පැවිදි කෙනෙකුන් කරා එළැඹැ සිවුරු සකසා හැඳැ පෙරවැ වැළැතැ හිඳ දොහොත් මඳුනේ තබා අවන් ලහුකාපත්ති කියා...**(සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 93).**

මෙම වාක්‍යය ද 'සඳ' (කල්හි) නිපාත සහිතව පූර්ව ක්‍රියා යෝජනයෙන් සංකීර්ණ වාක්‍ය බවට පත්වූවකි. සිඛවළඳ හා සිඛවළඳ විනිස සහ හෙරණසිඛ හා හෙරණසික විනිස වාක්‍ය සංස්ථිතියේ හමුවන සුවිශේෂී ලක්ෂණ දෙකකි, පුනරුක්තිය (රුවැඑසඑසදබ) සහ ලෝපය (Ellipsis). වාක්‍යාංශයක් හෝ වාක්‍යයක් හෝ සමාන ස්වරූපයකින් නැවත නැවත යෙදී ම පුනරුක්ති ය යි. කිසියම් කාරණයක් අවධාරණය කිරීමට හැඟීම්බරව දැක්වීමට මෙම ප්‍රයෝගය බෙහෙවින් භාවිත වේ.

පහන් දල්වත් පහන්වනසේ දනුත් කිම්දෝ හො? යි

කියැයුත්තේයැ. නිවන් සෙනසුන් ගුත්තියැ වනසේ දනුත් කිම්දෝ හො? යි කියැයුත්තේයැ. දොර වරුත් හොත් දොර වරුත් කිම්දෝ හො? යි කියැයුත්තේයැ. (**හෙරණසිඛ හා හෙරණසිඛ විනිස, විජිතනන්ද, 1993: 26**).

ඉහත සැම වාක්‍යයක් ම අවසන් වී ඇත්තේ ' කිම්දෝ හො? යි කියැයුත්තේයැ' යන වාක්‍ය ඛණ්ඩයෙනි. මෙනිසි එයින් වාක්‍යාංශ පුනරුක්තියක් ජනනය වෙයි. වාක්‍යයක කර්තෘ, කර්මය හෝ ක්‍රියාව ඉවත් කිරීම ලෝපයේ දී සිදු වේ. (Longman dictionary of Language Teaching and Applied Linguistics, 1992: 121; A Dictionary of Stylistics, 1990: 130). පාඨකයාට ප්‍රකරණානුබද්ධව හෝ පූර්වයෙන් සඳහන් වීම නිසා වටහා ගත හැකි වාක්‍ය කොටස් ඉවත් කිරීම ලෝප ය යි.

දැනැ දැන සතක්හු දිවිගැලවුව පරිජි වේ. (හෙරණසිඛ හා හෙරණසිඛ විනිස, 1993: 1).

මල්පක් ආදීන් කුලන් සගන්නා සඳහා දේ නම් දුකුළා වේ. (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 7**).

ඉහත පළමු නිදසුනේ 'දැන දැන සතක්හු දිවිගැලවුව' වාක්‍ය පාදයේ සහ දෙවන වාක්‍යයේ කර්තෘ වන්නේ 'භික්ෂුවක්' යන්න යි. එහෙත් ප්‍රකරණානුබද්ධය එය අවබෝධ කර ගත හැකි හෙයින් ඉහත වාක්‍යවල කර්තෘ පදය ඉවත් කර ඇත. කරුණු මාතිකා ස්වරූපයෙන් ඉදිරිපත් වන හෙයින් මෙම ලක්ෂණය විනිස ග්‍රන්ථවලට වඩා හමුවන්නේ මූලික ග්‍රන්ථවල ය. සිඛවළඳ විනිස සහ හෙරණසිඛ විනිස රචනා රීතියේ හමුවන ගුණාංග දෙකක් ලෙස ගුණනය (enumeration) සහ කේත මාරුව (Code-Switching) හඳුනාගත හැකි ය. ඉදිරිපත් කෙරෙන වස්තුව සම්බන්ධයෙන් දක්නට ලැබෙන ගති ලක්ෂණ වෙන වෙන ම කරුණු වශයෙන් හෝ නාමාවලියක් වශයෙන් හෝ පෙළ ගැස්වීම ගුණනයේ ලක්ෂණ ය යි. (**Galperin, 1977: p. 198**).

යම්කැලි නම් අඹපනු, කේල්පනු, ඇටියේල්පනු, මිදිපනු, හොලුපනු, බොරොලුදමුන්පනු, මීපනු ආදී පන්නි. (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999: 61**).

යම්කැලි විස්තර කිරීමේ දී කතුවරයා එයට ඇතුළත් වන දෑ නාමාවලියක් ලෙස ඉහත විග්‍රහයේ දී දක්වා ඇත. ඇතැම් අවස්ථාවල සංඛ්‍යාත්මක ව කරුණු දැක්වීම ද ගුණනයේ ලක්ෂණයකි.

සතරකැලි නම්ඃ යදකැලි, යම්කැලි, සතවුකැලි, යව්දිව්කැලි. (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999ඃ 61**).

මෙහි දී කතුවරයා ආහාරයට ගත යුතු වර්ග හතරක් පවතින බව දක්වා එම වර්ග හතර පිළිවෙළින් සංඛ්‍යාත්මක ව දක්ව යි. භාෂා කිහිපයකින් යමක් ඉදිරිපත් කිරීම කේත මාරුවේ දී සිදු වේ.

නිසජන සඳැ 'ඉදං මෙ භන්තෙ භෙසජ්ජං සත්තාහාතික්කන්තං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජාමි'යි පැවිජි කෙනෙක්නට නිසජා ඇවැත් දෙසන්නේ. (**සිඛවළඳ හා සිඛවළඳ විනිස, 1999ඃ 45**).

නිස දෙසිය යුතු ආකාරය පැහැදිලි කරන කතුවරයා නිස දේශනා කරන වාක්‍යය පාලියෙන් ඉදිරිපත් කර තිබේ. මෙනිසා සිංහල සහ පාලි යන භාෂා දෙක මෙහි දී කේත මාරුවට උපයෝගී වී ඇත. කේත මාරුවේ දී භාවිත වන්නේ සමකාලීන සමාජයේ ප්‍රචලිත භාෂාවන් ය. අනුරාධපුර යුගයේ දී පාලි භාෂාව වියතුන් අතර සංසරණය වූ ප්‍රධානත ම භාෂාවක් වූ බැවින් මෙම වකවානුවේ රචනා වන ගද්‍ය නිර්මාණවල කේත මාරුවීම් සිදුවන අවස්ථාවල දී පාලි භාෂාව යෙදී තිබේ.

**සමාලෝචනය**

සිංහල ගද්‍ය රචනා රීතියේ මුල්කාලීන ස්වරූප හඳුනා ගැනීමට සාධක වශයෙන් දැනට ශේෂ වී ඇත්තේ ධම්පියා අටුවා ගැටපදයේ එන හෙළටුවා පාඨ කිහිපය පමණි. රචනා රීතියක පරිපූර්ණ ස්වභාවය අධ්‍යයනයට මෙම පාඨවලින් ප්‍රබල මෙහෙයක් නො ලැබේ. එසේ වුව ද මෙම සාධක ක්‍රි. පූ. යුගයේ සිට හමුවන සෙල්ලිපි සමඟ තුලනාත්මක ව අධ්‍යයනය කිරීමේ දී සිංහල ගද්‍ය රචනා ක්‍රමය සංක්ෂිප්ත, සරල ස්වරූපයක් ගන්නා බව හඳුනාගත හැකි ය. කෙටි වාක්‍ය භාවිතය, තත්භව වාක්කෝෂය, විස්තරාර්ථ රහිත වීම, සරල, සුගම බව සහ පාලි රීතියට සමීපව වැඩීම වැනි දෑ එහි මූලික ලක්ෂණ වේ. හෙළටුවා

පාඨවලට පසුව සිංහල ගද්‍ය ශෛලියේ ස්වලක්ෂණ හඳුනා ගැනීමේ දී සීගිරි කැටපත් පවුරේ තිබී මෑතක දී සොයාගත් ගද්‍ය පාඨ ඉතා වැදගත් විය. ක්‍රි. ව. 8-10 සියවස්වලට අයත් මෙම පාඨවල හමුවන්නේ ද කෙටි රචනා ශෛලියකි. හෙළටුවා පාඨවල හමුවන රචනා රීතිය සහ සීගිරි පාඨවල හමුවන රචනා රීතිය අතර ප්‍රධාන වෙනස වදන් මාලාව පමණි. හෙළටුවා පාඨ, සෙල්ලිපි සහ සීගිරි පාඨවල ඇත්තේ පාලියෙන් බිඳුණු වදන් වුව ද සීගිරි ගද්‍ය පාඨ රචනා වන අවධිය වන විට එම වදන් ව්‍යවහාරානුසාරයෙන් සුබනම්‍ය විය. මෙනිසා මුල් රචනා ශෛලීන්හි නො වූ මටසිලුටු ස්වරූපයක් සීගිරි ගද්‍ය පාඨ රචනා රීතියේ දක්නට ලැබේ.

10 වන සියවස වන විට සිංහල භාෂාව දියුණු භාෂාවක් ලෙස වැඩී තිබිණි. මෙනිසා මෙම යුගයේ දී හමුවන්නේ සියලු කඩතොලු මැකී ගිය සාහිත්‍යකරණයට උචිත පරිදි සකලාංගවලින් පරිපූර්ණ වූ ගද්‍ය රචනා ශෛලියකි. එහි මූලික අවස්ථාව හමුවන්නේ ධම්පියා අටුවා ගැටපදයෙනි. ධම්පියාවේ ඇත්තේ සෙල්ලිපි රීතියට සමාන එහෙත් එයට වඩා දියුණු රචනා රීතියකි. විටක සංස්කෘත වදන් සහිත මිශ්‍ර රීතියක ගති ලක්ෂණ පැවතිය ද ග්‍රන්ථයේ බහුල ව දක්නට ලැබෙන්නේ පාලියට ක්‍රමයට සමාන ව සැකසුණු කෙටි රීතියකි. ධම්පියා අටුවා ගැටප ද වාක්කෝෂයේ බහුල ව හමුවන්නේ පාලි තත්භව හා තත්සම වදන් සමුදායකි. ඊට අමතර ව සමකාලීන සමාජයේ භාවිත වූ පොදු වදන් ද විටින් විට දැකගත හැකි ය. වාක්‍ය වින්‍යාසය විමසීමේ දී සුලභ ව දක්නට ලැබෙන්නේ කෙටි වාක්‍ය භාවිතයකි. එසේ වුව ද ඉතා දීර්ඝ නො වූත් ඉතා කෙටි නො වූත් වාක්‍ය ද ග්‍රන්ථයේ දුලභ නො වේ. ධම්පියා අටුවා ගැටපදයෙන් පසු සිංහල ගද්‍ය රීතිය ශාස්ත්‍රීය ව්‍යවහාරයට උචිත පරිදි තවදුරටත් වර්ධනය වූ ආකාරය සිඛවළඳ හා සිඛවළඳ විනිස, හෙරණසිඛ හා හෙරණසිඛ විනිස යන කෘතිවලින් පැහැදිලි ය. මෙම කෘතිවලින් හමුවන්නේ ශබ්දිම, පදිම, වාක්කෝෂ සහ වාක්‍ය යන සැම අංශයකින් ම දියුණුවට පත් රචනා ශෛලයකි. හෙළටුවා පාඨවල පටන් දක්නට ලැබෙන ශබ්දිම සංයුතියේ කෙටි බව එලෙසින් ම මෙම කෘතිවල දක්නට ලැබේ. විශේෂ ලක්ෂණයක් ලෙස හමුවන්නේ පූර්ව රචනා ශෛලීන්ට වඩා මාධූර්ය ගුණයට වැඩි අවධානයක් යොමු කර තිබීම යි. එහෙත් එය පොළොන්නරු යුගයේ දී මතුවන රචනා ශෛලීන්හි මෙන් ආකූල ස්වරූපයක් නො ව සරල

බව මත පදනම් ව ගොඩනැගුණකි. මෙම රචනා රීතියේ වාක්කෝෂය ධම්පියා අටුවා ගැටපද වදන් මාලාවට වඩා සුමට ස්වරූපයක් ගන්නේ හෙළ ව්‍යවහාරයට සමීප වන පරිදි පද බිඳ ගැනීමට කතුවරුන් දක්වා ඇති කුසලතා ව හේතුවෙනි. මීට අමතර ව එදිනෙදා ජන ජීවිතය හා බැඳි වදන් යොදා ගත් නිසා ධම්පියා අටුවාවට පසුව රචනා වන කෘතිවල රචනා ශෛලීන් තවදුරටත් සරල, සුගම, කෝමළ ස්වරූපයක් දරයි. වාක්‍ය රටා යෙදීමේ දී ද පූර්ව රචකයන්ට වඩා ශාස්ත්‍රීයත්වයක් පසුකාලීන රචකයන් විදහා දක්වා තිබේ. මෙනිසා කෙටි වැකි, දිගු වැකි මෙන් ම කෙටි-දිගු වැකි සංකලනය කරමින් විශිෂ්ට ලෙස සිය රචනා රීතිය හසුරුවන්ට සිබවළඳ හා සිබවළඳ විනිස සහ හෙරණසිඛ හා හෙරණසිඛ විනිස කතුවරුන්ට හැකියාව ලැබී තිබේ. සමස්තයක් ලෙස ගෙන විමසීමේ දී හෙළ බසෙහි සාරය කැටිකර ගනිමින් සරල, සංක්ෂිප්ත රචනා මාර්ගයක් ලෙස ඇරඹෙන ගද්‍ය රචනා ශෛලිය පාලි රීතියේ ප්‍රභාව ද ලබමින් සියලු ගුණවලින් පිරිපුන් විශිෂ්ට රචනා ශෛලියක් ලෙස අනුරාධපුර අග භාගය වන විට වැඩී ගොස් ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### සිංහල මූලාශ්‍රය


අදිකාරම්, ඊ.ඩබ්ලිව්. (1963). **පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය.** කොළඹ: ජේ. කේ. ජී. ජයවර්ධන.

අබේකෝන්, ඒ.එම්. ලොකුබණ්ඩාර, (2005). **අනුරපුර හා පොළොන්නරු සාහිත්‍යය.** කර්තෘ ප්‍රකාශන.

අභයසිංහ, ඒ.ඒ. (1990). **සිංහල වාක්‍ය විභාගය, (සරල වාක්‍යය).** කර්තෘ ප්‍රකාශන.

කුලසූරිය, ආනන්ද, (1999). **සිංහල සාහිත්‍ය 1.** බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

ගයිගර්, විල්හෙම්, (2013). **සිංහල භාෂාවේ ව්‍යාකරණය.** (පරි.) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ඤාණානන්ද හිමි, මාදෝවිට, (1963). **සිංහළ භාෂා ඉතිහාසය.** කොළඹ: සිරිසෝම රණසිංහ.

ධර්මකීර්ති, නිවන්දම, (2002). **සිංහල සාහිත්‍යයේ ස්වර්ණයුගය.** දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

නාගහපොත විජිත, (1964). **අනුරාධපුර සාහිත්‍යය.** කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

පඤ්ඤාකිත්ති හිමි, කොටහේනේ, (2000). **සාහිත්‍යය හා සමාජය.** කැලණියඃ වැලිමිටියාවේ කුසලධම්ම හිමි, 2000, 34 පිටුව.

පඤ්ඤාකිත්ති හිමි, කොටහේනේ, (1964). **සාහිත්‍යකථා - 2.** ප්‍රකාශක ස්ථාන හා ආයතන සඳහන් නොවේ.

**පාරාජිකපාළි**, (005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පුෂ්පකුමාර, නීල්, (2013). **සෙල්ලිපි වියරණ**, කොළඹඃ ෆාස්ට් බප්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්.

ප්‍රඥාරාම හිමි, යක්කඩුවේ, (1983). 'පාළියේ හා සිංහලයේ විකාශය.' **යක්කඩුවේ නාහිමිගේ ධර්ම ශාස්ත්‍රීය ලිපි**, (සංස්.) වැලිමිටියාවේ ධම්මකුසල හිමි, පෑලියගොඩඃ විද්‍යාලංකාර මුද්‍රණාලය.

ප්‍රියංක, බෙනිල්, (2020). **සීගිරි කැටපත් පවුරෙහි තිබී මෑතකදී කියවන ලද කුරුටු ගී සහ ලේඛන.** කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ල, විමල් ජී. (2010). **සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය.** කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, (1959). **ඌනපූරණසහිතො මහාවංසො.** කොළඹඃ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

මල්ලවාරච්චි, නිමල්, (2005). **සිංහල ගද්‍ය භාෂාවේ විකාශනය**, කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රත්නපාල, ඊ.ඇම්. (2009). **සිංහල සාහිත්‍ය ප්‍රදීපය දැල්වූ පැරැණි ලේඛකයෝ.** වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

රණසිංහ, චින්තක, (2014). **අනුරපුර පොලොන්නරු සාහිත්‍යය.** කොළඹඃ සූරස ප්‍රකාශන, 2014.

වාමන, (1962). **කාව්‍යාලංකාර සූත්‍ර වෘත්තිය.** (පරි.) ආනන්ද කුලසූරිය, කොළඹඃ ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

වික්‍රමසිංහ, මාර්ටින්, (2008). **සිංහල සාහිත්‍යයේ නැගීම.** රාජගිරියඃ සී/ස සරස පෞද්ගලික සමාගම.

වික්‍රමසිංහ, මාර්ටින්, (2016). **ව්‍යවහාර භාෂාව හා පරිණාම ධර්මය.** රාජගිරියඃ සී/ස සරස පෞද්ගලික සමාගම.

විජයසූරිය, විමල, (1992). **අනුරපුර යුගයේ විශ්ව කීර්තිමත් සිංහල මහා ලේඛකයෝ.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විජිතනන්ද හිමි, කැලිගම, (සංස්.) (1993). **හෙරණසිඛ හා හෙරණසිඛ විනිස.** කොළඹඃ සමයවර්ධන පොත්හල.

විතානගේ, සිරිසේන, (2002). **සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යය.** කර්තෘ ප්‍රකාශන.

විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, (සංස්.) (2008). **ධර්මප්‍රදීපිකාව.** කඩවැද්දුවේ සුමංගල හිමි, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

ලොකුබණ්ඩාර, ඒ.එම්. (2005). **අනුරපුර හා පොළොන්නරු සාහිත්‍යය.** කර්තෘ ප්‍රකාශන.

සද්ධාතිස්ස හිමි, කාරියමඩිත්තේ, (1958). **සිංහල භාෂා සාහිත්‍යය.** කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර, (1964). **සිංහල සාහිත්‍ය වංශය.** ප්‍රකාශක ස්ථාන සහ ප්‍රකාශක ආයතන නොදැක්වේ.

**සිඛවළඳ හා සිඛවළඳ විනිස.** (1999). (සංස්.) ප්‍රාචීන භාෂෝපකාර සමාගම, බත්තරමුල්ල: ප්‍රාචීන භාෂෝපකාර සමාගම.

සිරිසීවලී හිමි, බඹරැන්දේ, (2016). **සිංහල ශෛලිය.** කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සිරිසුමන හිමි, අගලකඩ, (2009). **සිංහල ව්‍යඛ්‍යාන සාහිත්‍යය.** කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සුරවීර, ඒ. වී. (2005). **සාහිත්‍ය විචාර ප්‍රදීපිකා.** කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක, ජී.බී. (1982). **සාහිත්‍ය දර්ශන සිතිවිලි.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හෙට්ටිආරච්චි, ඩී.ඊ. **ධම්පියා අටුවා ගැටපදය,** (සංස්.) (2009). බත්තරමුල්ල: ප්‍රාචීන භාෂෝපකාර සමාගම.

**ඉංග්‍රීසි මූලාශ්‍රය**

Wales, Katie, (1990). **A Dictionary of Stylistics**. London: Routledge.

Cuddon, J. A. (2013). **A Dictionary of Literary Terms and Theory**. Chichester: John Wiley & Sons Ltd.

Galperin, I.R. (1977). **Stylistics**. Moscow: Higher School.

Karunatillake, W.S. (2012). **Etymological Lexicon of the Sinhala Language vol. 1.** Colombo: S. Godage and Brothers.

Paranavitana" Senarath, (Ed.). (1970). **Inscription of Ceylon I**. Colombo: Department of Archeology.

Paranavitana, Senarat, (Ed) (1933). **Epigraphia Zeylanica Vol. III**. London: Oxford University Press.

Paranavitana, Senarat, (Ed) (1943). **Epigraphia Zeylanica Vol. IV**. London: Oxford University Press.

Paranavitana, Senarat, (Ed) (1955). **Epigraphia Zeylanica Vol. V**, Part 1. Colombo: Government Press.

Paranavitana, Senarat, (Ed) (2001). **Inscription of Ceylon II, Part II.** Colombo: Department of Archeology.

Ranavella, Sirimal, (Ed) (1966). **Inscription of Ceylon V, Part 1**. Colombo: Department of Archeology.

Richards, J.C. (Ed.) (1992). **Longman dictionary of Language Teaching and Applied Linguistics**. Harlow: Longman House, 1992.